ඇවිල්ලා මිනිහා අපට වෙඩි තිබ්බා, එතකොට අපි ඒ මිනිහාට වෙඩි තිබ්බා, එතකොට ඇවිල්ලා මොබයිල් එක වෙඩි තිබ්බා කියන කථාව. මොබයිල් එකේ ගිය නිලධාරීන් එක්කත් එයා කථා කරලා තිබුණා. ඒ ගොල්ලන් කියලා තිබුණා, කණ්ඩායමක් ඇවිල්ලා අර පැත්තට වෙඩි තිය තියා හිටියා. ඊට පස්සේ ඇවිල්ලා අපි වෙඩි තිබ්බා ඒ ගොල්ලන්ට කියන කථාව; ඒ ගොල්ලොත් කියලා තිබුණා. මුලිකවම ගත්තාම තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබ්බේ නැහැ කියන කථාව සනාථ කර ගන්න තරම් ප්‍රමාණවත් කරුණක් ඒ වෙද්දී හෙළිදරව් වෙලා තිබුණේ නැහැ, ස්වාමිනි. CCD එකේ නිලධාරීන් කියනවා, අර පැත්තේ ඉඳලා අපට වෙඩි තිබ්බා කියලා. එතකොට අපි ඒ ගොල්ලන්ට වෙඩි තිබ්බා කියලා කියනවා. මොබයිල් එකේ කට්ටිය කියනවා. අපි එතකොට ඇවිල්ලා වෙඩි තිය තියා හිටපු වාහනයට වෙඩි තිබ්බා කියලා. ඒ කථාව ඔක්කෝම සැසඳුණා. අපට කිසිම evidence එකක් තිබුණේ නැහැ. කවුරු හරි කියනවා නම් ඇවිල්ලා හැංගිලා ඉඳලා මිනිහෙක් අපට වෙඩි තියලා පැනලා ගියා කියලා ස්වාමීනි. අපි ඒක නැහැ කියලා තහවුරු කර ගන්නා තෙක්ම අපට ඒක බැහැර කරන්න බැහැ නේ, කවුරුත් කිව්වොත් එහෙම ඇවිල්ලා, මට මෙතැන ඉඳලා මිනිහෙක් වෙඩි තිබ්බා කිව්වොත්, පරීක්ෂණාත්මක දේවල්වලින් පසුව - එතැනත් මම ඉදිරියේදී කියන්නම්. ස්වාමීනි. එහෙම පරස්පරයක් එන්න හේතුව මොකක් ද කියලා. අපට කවුරු හරි මිනිහෙක් හැංගිලා වෙඩි තිබ්බා. ඒ හින්දායි මම වෙඩි තිබ්බේ ඒ මිනිහාට, එතකොට මට තව පැත්තකින් මිනිහෙක් වෙඩි තිබ්බා කියලා කිව්වාම, මේ වෙඩි තියපු එකටයි. අර පැත්තෙන් දෙවැනියට ආපු වෙඩි තියපු වාහනයේ කට්ටියයි ඔක්කෝම පිළිගන්නවා, එහෙම තමයි වුණේ කියලා. නැත්තේ, අර පැත්තේ ඉඳලා වෙඩි තියපු මිනිහා විතරයි ස්වාමීනි. ඒක ඇත්ත කථාවක්ද, බොරු කථාවක්ද, මොකක් ද කියන කාරණාව සම්බන්ධයෙන් ඔය වාතාවරණය තුළ කිසිම idea එකක් කාටවත් තිබුණේ නැහැ. ඉතින් පණ්ඩුල වීරසිංහ කිව්වේත් කථා කරලා, ඔය කියන කථාව අනුව සර්, මේකයි වෙලා තිබෙන්නේ කියලා. මොකද, ඔහු ඇහෙන් දැකපු සාක්ෂිකාරයෙක් නොවෙයි නේ ස්වාමීනි, වුණේ මොකක්ද කියන එක සම්බන්ධයෙන්. මෙන්න මෙහෙම තමයි වෙලා තිබෙන්නේ කියලා කිව්වේ. ඉතින් ඔහු දෙන අර්ථ නිරූපණය අනුව තමයි ස්වාමීනි. ඉහළ ඉහළ නිලධාරීන් හැම එක්කෙනෙකුම මට කථා කළාම කිව්වේ. පණ්ඩුල වීරසිංහ ගිහිල්ලා inquiry කරලා තිබෙනවා, මේක තමයි තත්ත්වය කියලා.

ප්‍ර: එතකොට ඔබතුමා තහවුරු කර ගත්තාද, scene of crime එකට, අපරාධ ස්ථානීය පරීක්ෂණයට ඔය කියන පණ්ඩුල මහත්මයා ගිහිල්ලා, observe කරලා, නිරීක්ෂණය කරලා ද ඔබතුමාට ඔය විස්තර කිව්වේ කියලා?

උ: ස්වාමීනි, ශ්‍රී ලංකා පොලීසියේ තිබෙන ක්‍රමවේදය අනුව ගිනි අවි පාවිච්චි කරලා වෙඩි තැබීමක් වුණොත් එහෙම ඒ ස්ථානයට SOCO නිලධාරීන් කැඳවීම අත්‍යවශ්‍යයි. ගිනි අවි විතරක් නොවෙයි, කැපුම් කෙටුම් වුණත් කැඳවනවා, ස්වාමීනි. නමුත් firearms පාවිච්චි කළොත් අනිවාර්යයෙන්ම ඒකට, ඒ scene එක විමර්ශනය සඳහා සඳ SOCO නිලධාරීන් යනවා. SOCO නිලධාරීන් ඉන්නේ ස්වාමීනි, කොට්ඨාශයක් භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යටතේ. ඔහුගේ පොලිස් අධිකාරි කාර්යාලය ඇතුළේමයි තිබෙන්නේ ඒ කාර්යාලය සහ විද්‍යාගාරයත්. ඒ අනුව මම පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් ඇහුවා. "SOCOලා සීන් එක සම්බන්ධයෙන් " කියලා. "

ඔව් සර් ඒවා ඔක්කොම කරනවා " කියලා. ඒ අනුව මම තහවුරු කර ගත්තා. SOCO නිලධාරීන් ඇවිල්ලා අපරාධ ස්ථානය ආරක්ෂා කරලා, එහි විද්‍යාත්මකව සාක්ෂි එකතු කිරීමේ කටයුත්තට අත ගහලා තිබෙනවා කියන කාරණය. ඊට අමතරව ඔහු මට දැනුවත් කළා, මේ ස්ථානයේ CCTV පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම ඔහු විසින් කොට්යාශ අපරාධ විමර්ශන අංශය, DCDB කියලා හඳුන්වන division යටතේ තිබෙන separate unit එකක්. හැම division එකකම තිබෙනවා DCDB කියලා Divisional Crime Investigation Bureau වශයෙන් හඳුන්වන එකක්. Directive Bureau. කොට්යාශ අපරාධ විමර්ශන අංශය. ඒකේ OICට ඔහු responsibility එක පැවරුවා කියලා වටේ තිබෙන CCTV කැමරා සියල්ල බලන්න කියලා. ඒ වගකීම ඔහුට භාර දුන්නා කියලා කිව්වා. ඒ අනුව මම දැන ගත්තා, වැලිගම HQI විසින් මේ inquiry එක කළාට මේ inquiry එක supervise කරන්නේ. SSP පණ්ඩුල වීරසිංහ. මොකද ස්වාමීනි, පොලිසියේ තිබෙන වර්ගී කරණය අනුව මේ කේස් එක HQIට handle කරන්න බැහැ. මොකද, හේතුව පොලීසියේ තිබෙනවා අපරාධ බල අපරාධ කියලා වර්ගයක් තිබෙනවා. GCR grave crimes කියලා. එතකොට සාමාන්‍ය පොලිසියකදී නම් grave crime එකක් විභාග කරන්න ඕනෑ OIC stations. Grave crimes වර්ගීකරණය කරලා තිබෙන්නේ, සොරකමක් නම් මුදල් වටිනාකම් අනුව. රුපියල් 50,000ට වඩා අඩු ඒවා සුළු සොරකම්, රුපියල් 50,000 සිට 100,000 ඒවා grave crimes. ලක්ෂයට එහා පැත්තේ ඒවා D report. D report කියන්නේ ස්වාමීනි, reportable crimes කියලා. ඒ හැම crime එකක් සම්බන්ධව report එකක් පොලිස් මූලස්ථානයට එවන්න ඕනෑ. එතකොට D report කියන ඒවා ASP විසින් visit කරලා, එතැන බලලා, investigation එක handle කරන්න ඕනෑ ASP කෙනෙක් ඇවිල්ලා. ඒ වර්ගීකරණය අනුව මේක D report එකක්. වෙඩි තබලා පුද්ගලයකු මිය ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව මේකේ investigation officer වෙන්නේ දිස්ත්‍රික්කය භාර ASP ස්වාමීනි. මේ සිද්ධියේ බරපතළකම අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා ගිහිල්ලා, උසස් නිලධාරීන් ගමන් සටහන් පොතේ වැලිගම පොලීසියේ, අංක 15ක් යටතේ instructions දීලා තිබෙනවා මේ investigation කළ යුතු ආකාරය සම්බන්ධව. එතකොට Directorක්ම ASP Divisionගේ supervision එක යටතේ ASP විසින් මෙහෙයවන inquiry එකක් divisional ස්වායත්ත අංශ වන SOCO සහ DCD සම්බන්ධ වූ inquiry එකක් මේ ස්ථානයේ ආරම්භ වෙලා තිබුණා කියන කාරණාව 31 වැනි දා උදේ 10, 11 වෙන විට මට තහවුරු වෙලා තිබුණා, පණ්ඩුලගෙන් ලැබුණු feedback එකත් එක්ක.

The Respondent IGP in his evidence-in-chief has categorically stated that he was completely satisfied that Weligama police station was conducting an independent investigation into this incident under the direction of SSP Matara Pandula Weerasinghe. It is in the following terms that he has mentioned his satisfaction.

ප්‍ර: ඒ ගොල්ලන් විසින් කරනවා කියලා කිව්වා. ප්‍රකාශ සටහන් කිරීම සහ අනෙක් කණ්ඩායම් කෙරුවේ. ඔතැන කණ්ඩායම් දෙකක් ඉන්නවා. එකක් කොළඹින් ගිය කණ්ඩායම. අනෙක මු. පො.ප වැලිගම විසින් කරලා තිබෙනවා. එතකොට ඔබතුමා ඒ අවස්ථාවේදී වැඩ බලන පොලිස්පතිවරයා විධියට ඒ සිද්ධ වෙච්ච විමර්ශනය ගැන සෑහීමකට පත් වුණාද?

උ: මට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පණ්ඩුල වීරසිංහ මහත්මයා ඒ සිද්ධිය සම්බන්ධ කෙනෙක් නොවෙයි නේ. ඔහු මේකට කිසිම සම්බන්ධතාවක් නැහැ. ඒ නිසා ඔහුගේ අධීක්ෂණය යටතේ මේ විමර්ශනය කෙරෙනවා. එයාට ඉහළින් ඉන්න DIG කෙනෙක් සහ SDIG කෙනෙක් ඉන්නවා. එයා ඒ විමර්ශනය ස්වාධීනව කරනවාද කියලා සොයලා බලන්න, ඒ නිසා ඒ ව්‍යුහය යටතේ එතැන අකටයුත්තක් වෙන්නේ නැහැ කියන කාරණය සම්බන්ධයෙන් මට පූර්ණ විශ්වාසයක් තිබුණා.

In addition, the Respondent IGP has also stated that DIG Sarath Kumara who was Matara and Hambanthota DIG was also there to give necessary instructions. He has further stated that no senior officer at any time brought to his notice, about any necessity to have, the investigation undertaken by Weligama police station (with regard to the incident in which two of the CCD members were injured by gunfire received from the night mobile patrol team operated under the HQI Weligama), transferred to any other unit for an independent investigation up until the last date he discharged the functions of the office of the IGP. This was up until the Supreme Court restrained him from doing so by its Order on 24-06-2024. Moreover, it is the Respondent IGP's position that he did not see any such reason as to why that investigation should have been taken out of Weligama police station and given to an independent unit. It is his position even as at the date he gave evidence before this committee that he is perfectly satisfied and does not repent on the fact that he did not take this investigation out of the hands of Weligama Police to give it to some other unit. The reasons he has attributed to the above is the fact that there could have been allegations if he had assigned this investigation to the CID because the CID is directly under his supervision. One can find his position in the following excerpt.

ප්‍ර: දේශබන්දු මහත්මයා, ඔබතුමා දන්නවා පොලිස්පති චක්‍රලේඛයක් තිබෙනවා, යම් කොට්ඨාශයක යම් අපරාධයක් සිද්ධ වෙලා ඒක ගැන විමර්ශනයක් සිද්ධ වෙද්දී ඒ විමර්ශනය කෙළින්ම පොලිස්පතිට පුළුවන් අරගෙන ඔබතුමා යටතේ තිබෙන සුවිශේෂ අංශ, ඒ කියන්නේ, Colombo CCD, එහෙම නැත්නම් CID එකට පවරන්න. ඒ චක්‍රලේඛය අනුව එහෙම පවරා දීම සිද්ධ කරන්නේ මොනවාගේ කරුණු සලකා බලලාද පොලිස්පති කෙනෙක්?

උ: ස්වාමීනි, මේ සිද්ධිය වුණේ දකුණු පළාතේ. දකුණු පළාතට ඉන්නවා වෙනම Senior DIG කෙනෙක්. දකුණු පළාතේ සිද්ධිය වූ මාතර සහ හම්බන්තොට ප්‍රදේශයට වෙනම DIG කෙනෙක් ඉන්නවා. මාතර කොට්ඨාශයට ඉන්නවා වෙනම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක්. මේ සිද්ධිය වෙන අවස්ථාවේදී ස්වාමීනි මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිරට අමතරව වැඩ බලන පොලිස්පති ධුරයෙන් කටයුතු කළා ස්වාමීනි. ඒ වන විට CID එකේ සෘජු අධීක්ෂණ නිලධාරියා මම. එතකොට මම කිව්වා Senior DIG කෙනෙක් ඒ වෙලාවේ සිටියේ

නැහැ කියලා. Senior DIG කෙනෙක් CID එක භාරව කවදාවත් ඉදලා නැහැ. මේ ළඟදී තමයි දාලා තියෙන්නේ. CID එකේ සෘජු අධීක්ෂණ නිලධාරියා මම ස්වාමීනි. SIU එකෙත් සෘජු අධීක්ෂණ නිලධාරියා මම. CID සහ SIU කියන අංශ දෙකම භාරව හිටියේ මම. මගේ යටතේ තිබෙන කණ්ඩායමක් තමයි CCD කියන්නේ. ඒ කියන්නේ මට අධීක්ෂණ වග කීමක් තිබෙන ආයතනයක්. DIG Colombo ගාවට මම ඉන්නේ. එතකොට CCD එකෙන් ගිහිල්ලා සිද්ධ වෙච්ච සිද්ධියක් සම්බන්ධව මම CCD එකෙන් ටීම් එකක් දැම්මත්, එස්අයියු එකෙන් ටීම් එකක් දැම්මත් දකුණු පළාත භාර Senior DIG යටතේ කෙරෙන විමර්ශනයට වැඩිය ඒක ස්වාධීනව වුණේ නැහැ. මම ඒක එහෙන් ගළවලා සීඅයිඩී එකට දාලා මේක යට ගැහුවා කියලා චෝදනාවක් මට අදත් ඒමේ හැකියාවක් තිබුණා, මම ඒ දේ කරලා තිබුණා නම්. ඒ නිසා මම අදත් සතුටු වෙනවා, මගේ සෘජු අධීක්ෂණය යටතේ තිබුණු අංශයකට දමන්නේ නැතිව මාතරින් කෙරුණ ඒ independent inquiry එක කරන්න ඉඩ දීම සම්බන්ධයෙන්. මම අදත් ඒ ගැන සෑහීමකට පත් වෙනවා. මොකද, මම ඒ වෙලාවේ බැරි වෙලාවත් ඕක දාලා තිබුණා නම්, සීඅයිඩී එකට හරි එස්අයියු එකට හරි ඔය නිලධාරීන් මොනවා හරි,- ඔය නිලධාරීන් 3.8 වැනිදා ගිහිල්ලා මේක වුණේ මෙහෙම නොවෙයි කියන කථාවට අමතරව සීඅයිඩී එක මොකක්ද ස්වාමීනි මේකේ සොයාගෙන තිබෙන පරිවේෂණීය සාක්ෂිය, ඔක ඔහොම නොවෙයි මෙහෙමයි වුණේ කියන්න. කිසිම දෙයක් සොයාගෙන නැහැ. මේ හුදු ප්‍රකාශ භයක් මත නේ ස්වාමීනි මේ කථාව ගොඩ නැඟිලා තිබෙන්නේ. මේ ගොල්ලන් මුලින් හිටපු ස්ථාවරයට වඩා අද වෙන කොට ස්ථාවරය වෙනස් වෙලා තිබෙන්නේ මේ ගොල්ලන් ගිහින් කියපු ප්‍රකාශ මත නේ. මොනවාද පරිවේෂණීය සාක්ෂි වලින් සොයාගෙන තිබෙන්නේ මේක වුණේ දැන් කියන කථාවට අනුව කියලා. මම තරයේ විශ්වාස කරනවා, භය වතාවක් එක කථාවක් කියලා තිබෙනවා, උසාවි දෙකක දිවුරුම් දීමකුත් ඇතුළත්ව. දිවුරුම් ප්‍රකාශ සහ දිවුරුම් දීම් ඇතුළත්ව. මම ස්ථිරව ප්‍රකාශ කරනවා, තව වැඩි දවසක් යන්න කලින් - ඒ දවස මට කියන්න බැහැ. මේ ගොල්ලන් ආයෙත් ප්‍රකාශ කරනවා, අපි දෙවැනි සැරේට කියපු ස්ථාවරයත් වැරදියි. වෙලා තිබෙන්නේ පළමුවැනි එක කියලා. මොකද, දෙපාරක් දිවුරුම් දීලා බොරු කියපු මිනිසුන්ට තව වතාවක්, - මම ඒක කියපු දවසට මම කොතැන හිටියන්, ඔබතුමාට මම කොහොම හරි දුරකථනයෙන් හරි අමතලා කියන්නම්, මෙන්න තව කථාවක් කියලා තිබෙනවා කියලා.

Even thereafter at later stages, the Respondent IGP has stated that the higher police officers in Matara Division did not bring to his attention, any such necessity. This is reflected in the following excerpt.

ප්‍ර: මට අතිශයින් වැදගත් වෙනවා, තව එක කරුණක්. දැන් ඔබතුමා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා විමර්ශනයක් කරගෙන යනවා කිව්වා. ඒ කරගෙන යන විමර්ශනය ගැන නියෝජ්‍ය පොලිස්පති මාතර - හම්බන්තොට අමතලා ඔබතුමා ඔහුගෙන් ඒක ගැන තොරතුරු විමසලා දැන ගත්තාද?

උ: ඔව්. සාමාන්‍යයෙන් දවසක උදේට පළාතක situation එක සම්බන්ධයෙන් ඒ පළාතේ Senior DIG මහත්මයා පොලිස්පතිට කථා කරන්න ඕනෑ. විනාඩි කිහිපයක්. සාමාන්‍යයෙන් උදේ හයට කලින්. ඒ කථා කරන අවස්ථාවේ පළාතේ වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් update කිරීමක්

කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වැලිගම එක සම්බන්ධයෙන් සතියක් විතර යනකම් මෙහෙක් තත්ත්වය මේකයි, මේකේ තත්ත්වය මේකයි කියලා. මොකද, පොලිස්පතිව දැනුවත් කිරීම ඒ පැත්තේ ඉන්න Senior DIG මහත්මයාගේ වගකීමක්. වැඩිමනත් වශයෙන් DIG මාතරට මාව අප්ඩේට් කරන්න යමක් තිබුණොත් එයා Senior DIG කියනකම් ඉන්නේ නැහැ. එයාට කෝල් එකක් අරගෙන කීමේ තැකියාව තිබෙනවා. ඒ විධියට මේ කාල සීමාව ඇතුළත ඩීඅයිජී මාතර සහ සීනියර් ඩීඅයිජී දකුණු පළාත විසින් අවස්ථා ගණනාවකදී මට කථා කරලා තිබෙනවා දිනපතාම. ඒ කථා කරන අවස්ථාවල මම ඔවුන්ගෙන් මේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන වල ප්‍රගතියත් විමසලා තිබෙනවා. මම එහෙම විමසන්නේ නැතිව මේ විමර්ශන වල ප්‍රගතිය. ඔවුන් විසින් කියපු අවස්ථාත් තිබෙනවා. ඒ අවස්ථාවල මෙම විමර්ශන වල වර්තමානයේ පවතින තත්ත්වය පිළිබඳ ඔවුන් මාව යථාවත් කරලා තිබෙනවා.

With regard to the calls given/received from SSP Nishantha de Zoysa, the Respondent IGP has admitted those calls as calls given/received between the Director Police Special Branch and the IGP at that time. It is the position of the Respondent IGP that those calls were calls in the ordinary course of duties. However, he has denied that he had specifically requested for information with regard to W15 hotel from SSP Nishantha de Zoysa. It is his position that SSP Nishantha de Zoysa has given false evidence in that regard to escape from his responsibility, fearing the possibility of him being named as a suspect in the Matara Magistrate's Court case. He also denies that SSP Nishantha de Zoysa had informed him that there was a lapse in the investigation undertaken by Weligama police station. However, the Respondent IGP has admitted that after SSP Nishantha de Zoysa was promoted as a DIG it was he who had recommended to the NPC to have DIG Nishantha de Zoysa appointed as DIG in-charge of Matara and Hambantota area. It is his position that DIG Nishantha de Zoysa as the DIG in-charge of Matara and Hambantota area also did not even thereafter submit to him, a report in this regard. In general, it is the position of the Respondent IGP that the higher officers in Matara are responsible for taking an action if they had observed any lapse in the investigation into the incident of shooting at Weligama carried out by Weligama police. According to him, it is because of that, he did not think it fit to direct the Special Investigation Unit which is directly under him in the Police Headquarters to conduct an investigation to ascertain whether there is any lapse on the part of the Police officers involved in the incident of shooting.

The following excerpt would show that the Respondent IGP did not know about the whereabouts of the CCD team during the time commencing from the point they came under fire by Weligama Police night mobile patrol up to the point they were stopped by Police officers on duty at Imaduwa Highway entrance.

ප්‍ර: ඔබතුමා දන්න විධියට ඒ වෙද්දී ඔවුන්ව රෝහල්ගත කරන්න පියවර අරගෙන තිබුණාද නැද්ද?

උ: 3.30 ට නිශාන්ත සොයිසා මහත්තයා මට කථා කරන අවස්ථාවේදීත් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදිලා තුවාලයි, එක්කෙනෙකුට අසාධ්‍යයි කියන මූලික තොරතුර තමයි ලබා දුන්නේ. රෝහල් ගත කිරීමක් හෝ ඔවුන් දැන් සිටින ස්ථානයක් පිළිබඳ දැනුම් දුන්නේ නැහැ. එවැනි දෙයක් කිව්වාට පස්සේ මට අනෙක් පැත්ත හැරිලා නිදා ගන්න පුළුවන්කමක් නැහැ, ස්වාමීනි. මේ සිද්ධිය සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දැනගෙන අවශ්‍ය උපදෙස් දීම මගේ වගකීම, ස්වාමීනි. ඊට පස්සේ මම ඔහුටත්, කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂටත්, ඊට පස්සේ එවකට ප්‍රදේශය භාරව හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ටත් මම අවස්ථා ගණනාවකදී කරුණා කාරණා විමසුවා. ඒ පසු අවස්ථාවකදී මට දැන ගන්න ලැබුණා, මේ නිලධාරීන් වෙඩි වැදීමෙන් පස්සේ ඉමදුව පිවිසුම අසලට ආපු අවස්ථාවේ එතැනදී රඳවා ගත්තා. එතැනදී වැලිගම HQI ගේ මැදිහත් වීම මත '1990 සුවසැරිය' ගිලන් රථයකින් මේ අය කරාපිටිය රෝහලට ප්‍රතිකාර සඳහා රැගෙන ගියා කියන කාරණාව දැන ගත්තා. ඒ හැරෙන්න මේ අය රෝහලට ගෙන යන අතරතුර, ඊට පස්සේ ඉමදුව මුර පොළේ ගිහිල්ලා හිර වෙලා ඉන්න අතරතුර මට ඒ අය සමඟ කිසිම communication එකක් තිබ්බෙත් නැහැ. මම ඒ සිද්ධිය සම්බන්ධයෙන් දන්නෙත් නැහැ. මෙහි සාක්ෂි ලියැවුණු ආකාරයට 3.42, 3.43 විතර වෙන කොට ඉමදුව මුර පොළෙන් මේ අය පිටත් කරලා යවලා තිබ්බා, කරාපිටිය රෝහල කරා. මට මේ සිද්ධිය සම්බන්ධයෙන් පළමුවරට දැනුවත් වුණේ පැය 3.30ට. ඒ කියන්නේ මට දැනුම් දීම වෙලා විනාඩි 10කින් විතර ගත වෙද්දී ඔවුන් කරාපිටියට ගෙනිහිල්ලා. ඒ නිසා ඔවුන්ව රෝහල් ගත කරන ආකාරය සම්බන්ධයෙන් හෝ රෝහල් ගත කළ යුතු ස්ථානය සම්බන්ධයෙන් කිසිම කෙනෙකු මගෙන් උපදෙස් පැතුවෙත් නැහැ. මම ඒ අයට උපදෙස් දීලාත් නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඉමදුව හයිවේ එන්ට්‍රන්ස් එකට ඔය CCD එකේ කණ්ඩායම ආවා කියලා මහත්මයා දැන ගත්තේ කීයට විතරද?

උ: එදා පාන්දර 3.30 න් පසු අවස්ථාවක, ස්වාමීනි. ඒ කියන්නේ, නිශාන්ත සොයිසා මහත්මයා විසින් මුලින් මට දැනුම් දුන්නාට පස්සේ නැවත නැවත ඒ අයත් කථා කරනවා, මම ඒ අයත් සමඟ යථාවත් වන අවස්ථාවකදී මට හරියටම ඒ වෙලාව කියන්න බැහැ. නමුත්, අවස්ථාවකදී, -

ප්‍ර: පැයක් විතර වාගේ ඇතුළත?

උ: පැයකට වඩා අඩු කාලයක් ඇතුළත වෙන්නත් පුළුවන්. මේ ගොල්ලන් Imaduwa exit එකේ තියාගෙන ඉන්නවා, නැහැ ප්‍රශ්නයක් නැහැ සර්. මේ ගොල්ලන්ව මෙතැනින් සුව සැරියෙන් අරගෙන ගිහිල්ලා තිබෙනවා කියන කථාවත් කවුරු හරි කථා කරලා කිව්වා.

The following excerpt is also relevant to show the position taken up by the Respondent IGP with regard to the allegation of his failure to take steps to have this incident investigated by an independent investigation unit.

ප්‍ර: ඔබතුමා සැහිමකට පත් වුණාද පණ්ඩුල වීරසිංහ මහත්මයා අපරාධ ස්ථානය පිළිබඳ කරන විමර්ශනය පිළිබඳව ?

උ: ඔව්, සාමාන්‍යයෙන් රටේ වෙන තැනක ඔය වාගේ සිද්ධියක් වුණොත් කරන විධියටම කිසි අඩුපාඩුවක් නැතිව විමර්ශනයක් කරලා තිබෙනවා, ස්වාමීනි.

ප්‍ර: ඒ වාගේ ඒ පොලිස් කණ්ඩායම් අධීක්ෂණය කරන ඉහළ පොලිස් නිලධාරීන්ගෙනුත් අධීක්ෂණය හරියට වෙනවාද කියලා ඔබතුමා බැලුවාද?

උ: බැලුවා. මම කලිනුත් පැහැදිලි කළා, ස්වාමීනි.

ප්‍ර: ඒක අනිශය වැදගත්, අධීක්ෂණය කියන කොටස විමර්ශනය කරන ගරු විනිසුරුතුමාට?

උ: එයාව supervise කරනවා නේ, DIG.-

ප්‍ර: ඔබතුමා දන්නවා, කොළඹ අපරාධ කොට්ඨාසයේ සෘජු අධීක්ෂණය කරන්නේ කොළඹ දිසාව භාර DIG බව?

උ: ඔව්.

ප්‍ර: ඔහු විසින් මේ කණ්ඩායම් ගැන සිද්ධ වෙච්ච සිද්ධිය ගැන අධීක්ෂණය පසුව හෝ අධීක්ෂණය සිදු කිරීම ගැන ඔබතුමා සොයා බැලුවාද?

උ: ස්වාමීනි. මේ සිද්ධිය 31 වැනි දා අලුයම වුණාට පස්සේ නිල වශයෙන් HQI වැලිගම විසින් දුරකථන පණිවුඩයක් එවා තිබෙනවා, කොළඹ CCD එකට. ඒ කියන්නේ සිද්ධිය වෙච්ච ප්‍රදේශයේ පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින් සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරීන් කොළඹ අපරාධ කොට්ඨාසයේ නේ. ඒ කොට්ඨාසයට officially inform කරලා තිබෙනවා සිද්ධිය සම්බන්ධයෙන් telephone message එකකින්. ඒ message එකේ පිටපතක් DIG Colombo විසින් ගෙන්වා ගෙන තිබෙනවා, ඔහුගේ කාර්යාලයට. ඊට පස්සේ ඔහු ඒ message එක සම්බන්ධයෙන් දුරකථනයෙන් මට කථා කරලා කිව්වා. වැලිගම HQI inform කරලා තිබෙනවා, මේ සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරීන් සිටි පරණ ස්ථාවරය අනුව, පාර්ශ්ව තුනක් සම්බන්ධ වුණාය කියනවා, නාඳුනන කණ්ඩායමක් වෙඩි තැබුවා, තවම ඒ සම්බන්ධයෙන් අනාවරණය වෙලා නැහැ. ඊට පස්සේ මොබයිල් එකෙන් වෙඩි තියලා තමයි මේ නිලධාරියා තුවාල වුණේ කියන ඒ යථා තත්ත්වය සම්බන්ධව ඒ පරණ ස්ථාවරයට අනුව කටයුතු මේ අය මෙහෙම ප්‍රකාශ කරනවා කියලා කෙටි පණිවුඩයක් දැනුම් දීලා තිබුණා ඒ පණිවුඩය අනුව මේ වෙඩි තැබීම ඇත්ත වශයෙන්ම කවුරුන් විසින් කළාද, ඒක වුණේ කොහොමද කියන කාරණාව

සම්බන්ධව විමර්ශනයක් ඒ වනකොටත් මාතර SSPගේ මාර්ගයෙන් ආරම්භ වෙලා තිබුණු නිසා ඒ විමර්ශන වල අවසානයේ නිගමන වලට එළඹෙන තාක්කල් මේකට වග කිව යුත්තේ CCD නිලධාරීන් ද, මේකට වග කියන්න ඕනෑ වැලිගම නිලධාරීන්ද, මේ දෙගොල්ලන්ම නැතිව පාතාලයේ කණ්ඩායමක් ඇත්තටම ඇවිල්ලා වෙඩි තියලා misunderstand වෙච්ච කාරණාවක් ද කියලා අවසන් අදියරේ තීරණයකට එන්න බැරි නිසා කිසිම විමර්ශනයක් කොළඹ CCD නිලධාරීන්ට විරුද්ධව ආරම්භ කරන්න කටයුතු කළේ නැහැ, ස්වාමීනි.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඒ වාගේම වැලිගම පොලීසියේ නිලධාරීන්ට හෝ මාතර කොට්යාසය භාර නිලධාරීන්ට ඒ වෙද්දී මොකක්වත්ම action එකක්,-

උ: නැහැ. ස්වාමීනි.

With regard to the documents produced before the Committee by the Secretary to the National Police Commission, the Respondent IGP has admitted the letters he has received and sent. It is his position that he submitted the facts contained in his letter to NPC on the basis of a report tendered to him by the DIG in charge of Matara-Hambantota. He has admitted that he has not taken any disciplinary action against any officer who was involved in this shooting incident. He has accepted the responsibility of the contents of the letter sent to NPC.

It is his position that he did not have supernatural powers to ascertain that the incident had indeed occurred in a different way. The following portion from his long reply to the relevant question asked in that regard could be reproduced as follows:

එබදු තත්ත්වයක් තුළ ඒ ගිය මිනිස්සු කිසි කෙනෙක් ඇවිල්ලා එදා කියලා තිබුණේ නැහැ. අපි පොලිස් ජීප් එක කියලා දැක දැකත්, අපි පොලිස්පති යවපු වැඩකටනේ. ආවේ. ඒ හින්දා අපි ඇදලා ආවා කියලා, එහෙම කවුරුවත් කියලා තිබුණේ නැහැ. ස්වාමීනි. ඒ වාතාවරණය තුළ තිබිච්ච තත්ත්වයත් එක්ක තමයි ස්වාමීනි. ඒ වාර්තාව සපයලා තිබෙන්නේ. ඒක පොලිස්පති වෙත ආවාට පසුව මට දිවැස් නැහැනේ. ස්වාමීනි ඒක එහෙම නොවෙයි කියලා දැනා ගන්නා. මම පදනම් කරගන්නේ නිලධාරීන් එවපු වාර්තා, ස්වාමීනි. ඒ වාර්තාව අනුව තමයි ස්වාමීනි. ජාතික පොලිස් කොමිෂන් සභාවට යැව්වේ ඒ වාර්තාව. එහෙම නැතුව ජාතික පොලිස් කොමිෂන් සභාවට බොරු කියලා, අසත්‍ය කරුණු කියා පාලා, හංගන්න, බේරන්න අවශ්‍යතාවකට නොවෙයි. මම කවුරුවත් එවෙලේ එව්වේ.

Soon after this answer, he has again repeated that the investigation conducted into this incident by the Weligama police station is adequate. The Respondent IGP has confirmed that this is his view even at the time of giving evidence before this Committee of Inquiry. The relevant question and answer are as follows:

ප්‍ර: අතිශය වැදගත් කොටසක් clear කරගෙනම යන්න ඕනෑ. පොලිස්පතිතුමාට සෘජු බලයක් තිබෙනවානේ, CID එකට සමහර විමර්ශන කොට්ඨාසවලයන් ගලවා භාර දෙන්න. පොලිස්පති චක්‍ර ලේඛනයක් ඒකට තිබෙනවානේ. පොලිස් නියෝගයක් තිබෙනවා. ඒ පොලිස් චක්‍ර ලේඛන සහ නියෝග අනුව ඔබට කෙටියෙන් ඕනෑ නම් කියන්න පුළුවන්, පොලිස්පතිතුමා කෙළින්ම මැදිහත් වෙලා යම් කිසි කොට්ඨාසයක තිබෙන, එක්කෝ පොලිස් ස්ථානයක තිබෙන ඉන්වෙස්ටිගේෂන් එකක් ගලවා අරගෙන සීඅයිඩී එකට දෙන අවස්ථා. පැහැදිලි කරන්න. මේ උතුම් වූ විනිසුරුතුමන්ලාට?

උ: එතැනදී බලන්න ඕනෑ, යම් කිසි සිද්ධියක් වෙලා තිබෙනවා නම්, ඒ පොලිසියේ මිනිස්සුන්ගේ involvement එකක් තිබෙනවා නම්. ඒ සිද්ධියට; ඒ හින්දා ඒ පොලිසියෙන් විමර්ශනය කළොත් එහෙම, ඒ පොලිසියේ මිනිස්සු ඒකට පක්ෂග්‍රාහිව ඒ මිනිස්සු බේරෙන්න වැඩ කරයි කියලා පෙනෙනවා නම්. එතැනින් ගලවා ඉවත් කරලා CID එකට හෝ නැත්නම් වෙන unit එකකට හෝ දමන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර වෙලාවට ඒ පැත්තේ මිනිස්සු පෙළපාලියක්, උද්ඝෝෂණයක්, පිකට්ං එකක් කළොත්, මේ පොලිසිය විශ්වාස නැහැ අපට; මේ ගොල්ලන් තමයි මේක කළේ; මේක විශ්වාස නැහැ කියලා, එහෙම නැත්නම් නිලධාරීන්ට විරුද්ධව කිව්වොත්, මෙයා මේකට සම්බන්ධයි කියලා, පොලිස්පතිවරයාට පුළුවන් ඒක දමන්න.

ඊට පසුව ජාතික පුවත්පත්වල, රූපවාහිනිවල කියනවා, කථා කරලා මෙන්න, මේක මෙහෙම වුණේ කියලා. එතකොට දමන්න පුළුවන්, පොලිස්පතිවරයාට. එහෙම නැත්නම් ජාතික වශයෙන් සුවිශේෂී වැදගත්කමක් තිබෙනවා නම්, රටට බලපාන. ලොකු sensitive එකක් තිබෙනවා නම් පොලිස්පතිවරයාට අභිමතයක් තිබෙනවා, රයිට්, මෙතැනින් කරන්න එපා inquiry එක, දමන්න CID එකට කියලා.

මට නම් මේ සිද්ධිය සම්බන්ධයෙන් එබඳු category එකකට වැටෙනවා කියලා කිසිම ආකාරයේ වැටහීමක් තිබුණේ නැහැ. අදටත් මම එහෙම විශ්වාස කරන්නේත් නැහැ. ඒ නිසා එහෙන් කරපු inquiry එක ප්‍රමාණවත් කියලා - ජාතික ජන බලවේගයේ රජයක් එනකම් ඉඳලා අපි ලියන්නේ කියන නිර්නාමික පෙත්සමකට මේ inquiry එක ආරම්භ වෙලා තිබෙන බව ස්වාමීනි, මගේ ප්‍රකාශය ගත් දවසේ බන්ධනාගාරයේදී මම දැන ගත්තා. එතැනදීම මම දැන ගත්තා, මොකක්ද මේ යන පාර, මොකක්ද අවශ්‍යතාව කියලා. එතකොට ජාතික ජන බලවේගයේ රජයක් එනකම්ම ඉඳලා තිබෙනවා ඉවසා ගෙන කවුරු හරි කෙනෙක් ඒ තිබෙන තොරතුරු ටික දෙන්න. ඒ කියන්නේ වෙන රජයක් යටතේ දෙන්න ඉඳලා නැහැ. ඒ තොරතුරු. ජාතික ජන බලවේගයේ රජයක් එනකම්ම ඉඳලා තිබෙනවා, ඉවසාගෙන. මොකද, හේතුව වෙන රජයක් යටතේ ඒ තොරතුරු දීලා එයා සෑහීමකට පත් වෙලා නැහැ. ඉතින්

එතැනින්ම තේරෙනවා. ස්වාමීනි අපි ඉන්න කොට ඒක ලැබුණේ නැහැ කියන එක. අපිට දීලා නැහැ ඒ තොරතුරු කවුරුවත්.

Giving evidence with regard to the failure of CCD officers in the van to identify themselves to Weligama night mobile patrol, the Respondent IGP has also taken the view that the CCD team led by CI Anslem de Silva should have identified themselves to Weligama night mobile patrol officers. The Respondent IGP has taken the view that it is not possible to accept the fact that the CCD team in the van did not identify that it was the Weligama night mobile patrol jeep which arrived and parked their Land Cruiser Police jeep in front of CCD's KDH van which was parked at that time. This is a clear indication that the Respondent IGP has also condemned the action of CCD team members escaping from the officers of the Weligama police night mobile patrol and speeding away from that place. The relevant excerpt in this regard is reproduced below.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: අර මහත්මයා කිව්වා වාගේ ඇන්සලම් ද සිල්වා මහත්මයාගේ කණ්ඩායම වැලිගම ජංගම මුර සංචාරයේ නිලධාරීන්ට කථා කරලා නැහැ?

උ: ස්වාමීනි, වෙඩි තැබීම වුණාට පස්සෙත් කථා කරලා නැහැනේ. වෙඩි වැදීගෙන මේ ගොල්ලන් ඇවිල්ලා තිබෙනවා නේ ස්වාමීනි. මම කියන්නේ, වෙඩි වැදුණාට පස්සේ සාමාන්‍යයෙන් අපි කවුරු වුණත් අපිත් එක්ක ගිය කණ්ඩායමක ගිය මිනිහෙකුට වෙඩි වැදුණා නම්, මේ මිනිහා මැරෙයිද කියන ප්‍රශ්නය උඩ, වෙඩි වැදුණාට පස්සේ ස්වාමීනි, නිකම් අත පය සිරිලා තිබෙන්නේ නැහැ නේ. අඩු ගණනේ අපට මේ සාක්ෂි වලින් හෙළිදරව් වුණේ. අර මනුස්සයා ඇඳගෙන හිටපු ජැකට් එකවත් මේ ගොල්ලන් ගලවලා බැලුවේ නැහැ කියලා නේ, මේ ඉමදුවේදී අර 1990 න් ඇවිල්ලා බලන්කල්. නමුත්, ඒ අස්සේ කියනවා කථා කරලා, අඳුරු තැනකට දාලා ගහගෙන ආපු නොම්මර තහඩු ගලවල අයින් කරලා, වාහනයේ original ඒවා සවි කෙරුවා කියලා. ඒ ගොල්ලන් එහෙම කරලා තිබෙනවා නම් ස්වාමීනි, ඒ කටයුත්තටත් විනාඩි කිහිපයක් ගතවෙන්න ඇති නේ, අඩු ගණනේ විනාඩි 5ක්, 10ක්වත් ගත වෙන්න ඇති නේ. එතකොට මේ ගොල්ලන්ට තමන් එක්ක ආපු මිනිහාට වෙඩි වැදිලා තිබුණා නම්, ඉස්පිරිතාලයට ඇතුල් කිරීම තමයි ඊළඟට තිබෙන ප්‍රමුඛතම රාජකාරිය කියලා වැටහීමක් තිබුණා නම් ඊට වඩා ටිකක් ඉක්මන් කරගන්න තිබුණා ඔය කටයුත්ත.

ප්‍ර: දැන් මහත්මයාගේ මතය අනුව ඔය CCD එකේ කණ්ඩායමට වැලිගම ජංගම මුර සංචාරයේ යෙදුණු නිලධාරීන්ට කථා කරලා උදව් ගන්න තිබුණා?

උ: මම කියන්නේ. සිද්ධියට පෙර කෙසේ වෙතත්, සිද්ධියක් වුණා නේ ස්වාමීනි. ඊට පසුව හෝ ඔවුන්ට තිබුණා කථා කරන්න. මම දන්නේ නැහැ ස්වාමීනි, කොතෙක් දුරට ප්‍රායෝගිකද කියලා මේ වාහනය පොලිස් වාහනයක් කියලා අපි හඳුනා ගත්තේ නැහැ කියන කථාව. ඔබතුමා ඉහාම හොඳින් බුද්ධිමත්ව ප්‍රශ්න කිහිපයක් ඇහුවා සාක්ෂිකාරයින්ගෙන්, ඔය වාහනය යන කොට පාර දෙපැත්තේ හිටපු මිනිස්සු ප්‍රතිචාර දක්වන්නේ කොහොමද කියලා. එතකොට මේ සාක්ෂිකාරයෝ කථා කරලා කිව්වා, සමහර මිනිස්සු දුවනවා කියලා, සමහර මිනිස්සු හැංගෙනවා කියලා. එහෙම එකක් තිබුණාම,මේ ජීප් එක මෙතැනට ආවා නම්, එතැන තිබුණු ආලෝක තත්ත්වයත් එක්ක මේක නිල් පාට පොලිස් කියලා ගහලා තිබුණු ජීප් එකක් කියලා අර මිනිස්සු කිව්වා නම්, ඕක දැක්කේ නැතුවයි අපි ගියේ කියලා කියන කථාව කොයි තරම් දුරට ඔබතුමා සැලකිල්ලට ගන්නවාද කියලා මම දන්නේ නැහැ ස්වාමීනි. එහෙම දැක්කා නම්, ඒ වාහනයෙන් වෙඩි තියන කොට එයා දැනගන්න ඕනෑ පොලිසියෙනුයි මේ වෙඩි තියන්නේ කියලා. පොලිසියෙනුයි මේ වෙඩි තියන්නේ කියලා දැනගත්තාට පස්සේ එයාලා කළ යුතුව තිබුණේ ඒ මොහොතේ නරි වාහනය නතර කරලා, වෙඩි තැබීම නතර කරපුවාම බැහැලා ඇවිල්ලා, වෙඩි තියන්න එපා. අපි පොලීසියේ නිලධාරීන්, කරුණා කර මේක ඇතුළේ ඉන්න මිනිස්සුන්ට වෙඩි වැදිලා, මේ මිනිස්සු ඉස්පිරිතාලේ ගෙනියන්න උදවු කරන්න කියලා කියන එක. එහෙම දැක දැකත් මේ ඉමදුව වාගේ තැනකට එනකල් ආපු එක අනුව මම හිතන්නේ නැහැ. ඒ ගොල්ලන් බුද්ධිමත් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවා කියලා. සාමාන්‍ය දැනීමට අනුව එහෙම කරපු එක හොඳයි කියලා මට හිතෙන්නේ නැහැ.

ප්‍ර: දැන් වැලිගම පොලිසියෙන් ජංගම මුර සංචාරයෙන් එතැනට ඇවිල්ලා තිබෙන බව සත්‍යයි?

උ: ඔව්, දැන් එය සනාථ වෙලා තිබෙනවා නේ ස්වාමීනි. ඒ නිලධාරීන් ප්‍රකාශයක් දීලා තිබෙනවා නේ.

ප්‍ර: මහත්මයා එතැන සිටියේ නැති බව මම දන්නවා. මහත්මයාගේ මතය අනුව ඒ ගොල්ලන් uniform එකෙන් හිටපු බවත් සත්‍යයක්?

උ: ඒ අය සහ හමුදාවේ නිලධාරීන් ඔක්කොම uniform ඉඳලා තිබෙන්නේ.

ප්‍ර: හැබැයි, හමුදා නිලධාරීන් බැස්සේ නැහැ. ' පොලිස් ' කියා mark කරපු ජීප් එකක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍යයෙන් පොලිස් කියලා පින්තාරු කර තිබුණු ජීප් රථයක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්තයා කියන්නේ, ඒ තත්ත්වය යටතේ ඔය CCD එකේ කට්ටිය අනිවාර්යයෙන්ම ඔය වැලිගම පොලිසියෙන්, එහෙම නැත්නම් මොකක්හරි පොලිස් ස්ථානයකින්, ජංගම මුර සංචාරය කියන්නේ මොකක්ද කියන එක අමුතුවෙන් ඒ ගොල්ලන්ට පැහැදිලි කළ යුතු දෙයක් නොවෙයි නේ. ඒ ගොල්ලන් පොලිසියේ සේවය කරන අය නේ. මේ පොලිසියේ ජංගම මුර සංචාරයේ යෙදෙන ජීප් එකක් තමයි ඔතැනට ආවේ කියන එක දැනගත යුතුව තිබුණා?

උ: මගේ පුද්ගලික අදහස අනුව නම් එහෙම දැනගන්න තිබුණා. මගේ පුද්ගලික අදහස ඔබතුමාගේ දැන ගැනීම සඳහා විතරයි කියන්නේ. ඔය දෙපාර්ශ්වයම ටිකක් ඉවසිලිවන්තව ක්‍රියා කළා නම් වෙඩි තියාගන්න එකත් වළක්වාගන්න තිබුණා කියලා මම හිතනවා ස්වාමීනි. ඒකෙන් මම අදහස් කරන්නේ, අපේ නීතිඥ මහත්මයා හරස් ප්‍රශ්න වලදී ඒක ඇහුවා. ජංගම මුර සංචාරය ඔය ස්ථානයට ආපු අවස්ථාවේදී කරපු වෙඩි තැබීමක්; CCD නිලධාරීන් වෙඩි තැබීම නතර වෙලා තිබුණා කියලා මේ සාක්ෂිවලින් කියැවුණා. ඒ කියන්නේ නවත්වලා තිබුණු CCD වාහනයේ ඉඳලා කරපු වෙඩි තැබීම නතර වුණු අවස්ථාවේ තමයි වැලිගම පොලිසියේ ජීප් එක ඇවිල්ලා තිබෙන්නේ. ඒ වෙලාවේ ඇවිල්ලා මහ හරස් කරලා නැවැත්තුවා කියලා කිව්වා, වාහනය. ඒ වෙලාවේ මේ ගොල්ලන්ගේ චෝදනාව තමයි මේ ආපු වාහනය හදුනා ගන්න බැරි වුණා කියන එක. එතකොට මේ නිල ඇඳුමෙන් ආපු එක නිලධාරියෙක් බැහැලා වාහනය පැත්තට පොඩ්ඩක් ආවා කියලා කියනවා. ඒ වෙලාවේ මේ ගොල්ලන්ට තිබුණා කියලා මම විශ්වාස කරනවා, මේ වාහනයෙන් ඔතැනින් එකපාර පැනලා යන එක නවත්වා ගන්න, ඊට වඩා ඒ ගොල්ලන් ගාව තිබුණු තුවක්කු බලය හරි strength එක හරි පාවිච්චි කරලා ඊට වඩා effective විධියට වැඩ කරන්න තිබුණා. එතකොට ඒ පැත්තෙන් ඒ ගොල්ලන්ගේ වගකීමකුත් මම දකිනවා.

ප්‍ර: ඒ කියන්නේ වැලිගම mobile එක?

උ: එහෙමයි. වැලිගම mobile එකත් මීට වඩා, ඒ සාජන් මහත්මයෙක් නේ in-charge විධියට ඇවිල්ලා හිටියේ. සමහර විට එතැන ටිකක් experience තිබෙන IP කෙනෙක්, SI කෙනෙක් වාගේ හිටියා නම් ඒ වෙලාවේ, සමහර විට ඊට වඩා හොඳට ඒක handle කරගන්න තිබුණා කියලා මම හිතනවා ඔව්වර දුර දිග යන්නේ නැතුව. ඊළඟට, CCD එකේ නිලධාරීන් ඒ වෙලාවේ ක්‍රියා කරපු ආකාරය, දුර දිග බලන්නේ නැතිව ගත්ත ක්‍රියා මාර්ගය නිසා තමයි දෙවැනි වෙඩි තැබීමක් දක්වා මේක දුර දිග ගිහින් තිබෙන්නේ. ඒ දෙවැනි වෙඩි තැබීම නිසා තමයි මේ නිලධාරීන් දෙදෙනා මැරිලා තිබෙන්නේ. එතකොට මාතර මහෙස්ත්‍රාත්තුමාගේ මරණ පරීක්ෂණයේදී එතුමා නිගමනයකට ඇවිල්ලා තිබෙනවා පුද්ගලික ආරක්ෂාවේ අයිතිය යටතේයි මේ ගොල්ලන් වෙඩි තැබුවේ කියලා හමුදා නිලධාරියා ඔක්කොම එතැනින් නිදහස් කර තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් කථා කරන්න කැමැති නැහැ. නමුත්, මෙතැනදී අනාවරණය වෙච්ච කරුණු අනුව තමන්ව පසු කර පළා යන වාහනයකට වෙඩි තබා තිබෙනවා ඒ පිරිස. ඒ වෙඩි තැබීමෙන් තමයි මේ පුද්ගලයින් මිය ගිහින් තිබෙන්නේ සහ

තුවාල ලබා තිබෙන්නේ කියලා අපි සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔබතුමාගේ අවධානයට යොමු කළා. කෙසේ වුණත් ඒක අදාළ නැහැ මෙතැනට, මම කියන්නේ මේ නිලධාරීන් කණ්ඩායම් දෙක වගකීමෙන් යුතුව ක්‍රියා කළ යුතුව තිබුණා. ඒකෙන් මම පොඩ්ඩක්වත් කියන්නේ නැහැ, පළවෙනියට වුණා කියලා සිද්ධිය, ඒ කියන්නේ CCD එකේ නිලධාරීන් හෝටලය දෙසට වෙඩි තැබීමත්, ඒ වාගේම හෝටලය පැත්තේ ඉඳලා මේ ගොල්ලන්ට වෙඩි තැබුවා කියන කථාවත්, ඒ දෙකට යටත්ව මම නථා කරන්නේ නැහැ. ඒවා ඔක්කොම ඇත්තට කොහොම වුණාද කියන කාරණාව සනාථ කරගන්නත් එක්ක මම මේ කථාව කියන්නේ.

ප්‍ර: දැන් මහත්මයා කියන්නේ, CCD එකේ අය වැලිගම පොලිස් ජීප් එක දැක්කේ නැහැ එතැනින් යන කොට කියන එක පිළිගන්න බැහැ කියලා?

උ: මට නම් ස්වාමීනි, ප්‍රායෝගික තත්ත්වයත් එක්ක පිළිගන්න බැහැ. ඇන්සලම් ද සිල්වාට දෝංකාරය නිසා කන් දෙකට අත් දෙක තියාගෙන පහත් වුණා කියන එක මට විශ්වාස කරන්න පුළුවන්. ඒමාකද, ඔහුගේ වයස සහ ඔහුගේ රෝගී තත්ත්වයන් එක්ක. නමුත්, රියදුරා වාහනය එළවන්න ඕනෑ ඉස්සරහා බලාගෙන, ස්වාමීනි. මොකද, එයාට බැහැ නේ ඔළුව අස්සේ හංගාගෙන යන්න. එතකොට එයා ඒක දැකිය හැකිව තිබුණා. ඇන්සලම් ද සිල්වා ලෙඩෙක් කියලා එක මම කලිනුත් ප්‍රකාශ කළා, මිනිහාට shock එකක් එන්න ඇති වෙඩි තියද්දී ඇති වෙච්ච කම්පනයන් එක්ක, මිනිහා කන් දෙකට අත් දෙක තියාගෙන පහත් වුණා කියන එක. සාමාන්‍යයෙන් මෙහෙම මෙහෙම වෙඩි තියනවා නම් කවුරුහරි ඇවිල්ලා, එතැන ඉන්න බැහැ නේ ස්වාමීනි. ඒ හේතුව නිසා අපට ඒ කථාව පිළිගන්න පුළුවන් ස්වාමීනි. නමුත්, රියදුරා සහ ඉස්සරහා අසුනේ හිටපු අනෙක් නිලධාරියා ඒක නොදැක ගියා කියලා කියන කාරණාව මට නම් පිළිගන්න බැහැ ස්වාමීනි. ඒ වෙලාවේ ඒක කොහොම වුණාද කියලා ඒ ගොල්ලන් කියන කථාව. නමුත්. සාමාන්‍ය පුද්ගලයෙක් වශයෙන් මට පුද්ගලිකව නම් හිතෙන්නේ නැහැ එහෙම නොදැක ඉන්න ඉඩ තිබුණා කියලා. මොකද, පොලිස් කියන වාහනය ගිනි පෙට්ටියක් වාගේ එකක් නොවෙයි නේ ස්වාමීනි. අර කිව්වා වාගේ පොඩි ළමයෙක් වුණත් හඳුනන වාහනයක් නේ ස්වාමීනි.

ප්‍ර: ඕක තමයි සාමාන්‍ය තත්ත්වය යටතේ ඕනෑම පොලිස් නිලධාරියෙකුගේ මතය, ඔය සිද්ධිය සම්බන්ධයෙන්. මේ වැලිගම පොලීසියේ ජීප් එක දැක්කේ නැහැ කියන එක සම්බන්ධයෙන්?

උ: බහුතරයක් මිනිස්සුන්ගේ අදහසක් වෙයි ස්වාමීනි ඒක. අනුන්ගේ අදහසක් මට කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: මහත්මයා කිව්වා වාගේ ඒක ප්‍රායෝගිකව වෙන්න අමාරුයි නේ?

උ: මම හිතනවා ස්වාමීනි.

The Respondent IGP has repeatedly stated that even as at present he is of the opinion that the team led by CI Anslem de Silva was engaged in an official duty on 30-12-2023, in front of W15 hotel. It is also the Respondent IGP's position that CI Anslem de Silva led his team to execute the order he had given to the Acting Director CCD ASP Neville de Silva on 29-12-2023 at the Police Headquarters. This is reflected in the following excerpt:

ප්‍ර: ඔබතුමා සාක්ෂි දෙමින් සිටියේ මෙම සිද්ධියට පාදක වන W15 හෝටලය ඉස්සරහට ගිය පොලිස් කණ්ඩායම් දෙක ගැන. ඔබතුමාගේ නිරීක්ෂණය අනුව 2023.12.30 දින ඇන්සලම් සිල්වා මහත්මයාගේ නායකත්වයෙන් කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායම නීත්‍යානුකූල කාර්යයකට ගියා කියලා ඔබතුමා නිරීක්ෂණය කරනවාද?

උ: ඔව් මම නිරීක්ෂණය කරනවා. ඔවුන් පිටවීමට පෙර යෙදලා ගිහින් තිබුණු පිටවීමේ සටහන් අනුව, මා විසින් 2023.12.29 වෙනි දින උදේ පොලිස් මූලස්ථානයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂකට මා විසින් දීපු නියෝගයට අනුකූලව ඒ ලැයිස්තුවේ සඳහන් පුද්ගලයි අත්අඩංගුවට ගන්න යනවා කියලා යොදලා තිබෙන පිටවීමේ සටහන් එක්ක, ශ්‍රී ලංකා පොලීසියට අයිති වාහනයකින් යාම සඳහා අයදුම්පතක් යොදලා ඒකට පූර්ව අනුමැතිය ගත්තා කියලා සටහන් යොදලා යාම සම්බන්ධව ඔවුන් නීත්‍යානුකූල රාජකාරියට ගියේ කියලා මම පිළිගන්නවා.

It is also the position of the Respondent IGP that the officers in Weligama police night mobile patrol jeep did not commit any offence and was a team which had only engaged in their official duties. This is supported by the fact that the learned Counsel for the Respondent IGP did not seek to challenge the evidence of Police Sergeant Ajith Sisira Kumara and Army Sergeant Ruchiranga during their evidence in the Inquiry. It is the position of the Respondent IGP that he still relies on the initial account given by the CCD Officers led by CI Anslem de Silva with regard to the way the two CCD Officers had got injured in the shooting incident at Weligama. It is on that basis that he has attempted to show to this Committee that there were empty cases of cartridges which could be presumed to have been fired from the alleged suspected unknown gunman. It is his position that the SOCO officers of Matara had found some empty cartridges at the scene. He has stated that since SI Maduranga of the CCD has fired 09 rounds of ammunition, it should have been an organized crime group which had fired the rest of the cartridges. It is the position of the Respondent IGP that SOCO officers of Matara had not engaged in any illegal act in their investigation.

With regard to the availability of CCTV footage around the scene of the crime, the Respondent IGP's position is that he was satisfied of the fact that the Weligama police investigators had not found any relevant CCTV footage during their investigation.

Giving evidence with regard to the approval of the reward to PS Upul of the CCD who was killed in the shooting incident, it is the position of the Respondent IGP that he became satisfied that the team had acted within the course of their duties; the team had not engaged in an illegal activity, before he signed on **P-7** granting his approval both as the Senior DIG in charge of the Western Province and as the Acting Inspector General of Police. He has identified and accepted the documents marked **P-2** to **P-7** upon them being shown to him before the Committee. It is his position that he had no reason to suspect in recommending/granting his approval for the payment of this reward out of the Police Reward Fund.

It is his position that he acted on the account given to him by the Acting Director CCD ASP Neville de Silva in this regard. This is reflected in the following excerpt taken from his evidence:

උ: උපුල් නිලධාරියා මිය ගිය අවස්ථාවේ සිට වැඩ බලන්නා අධ්‍යක්ෂකත් එක්ක මට ඒ සම්බන්ධව communication එක තිබුණා. ඒ වාගේම උසස් නිලධාරීන්, DIG Colombo මේ සම්බන්ධයෙන් කථා කළා. ඒත් එක්කම දකුණු පළාතේ උසස් නිලධාරීන් කථා කරලා ඒ අනුව CCD එකේ සිටින පොලිස් සැරයන් උපුල් තමයි මිය ගියේ කියන කාරණාව මට හොඳින් තහවුරු වෙලා තිබුණේ, ඒ අවස්ථාව වන විට.

ප්‍ර: ඔබතුමා ඔහුගේ සේවා කාලය ගැන තහවුරු කර ගැනීමක් කළාද?

උ: ඔව්. ඇත්ත වශයෙන්ම නිලධාරියෙක් මිය ගියාට පස්සේ ඒ නිලධාරියා කෙබඳු ආකාරයේ නිලධාරියෙක්ද යන්න විමසීම සාමාන්‍ය දෙයක්. ඒ අනුව එම නිලධාරියා මිය ගියා කියපු අවස්ථාවේ වැඩ බලන අධ්‍යක්ෂ නෙවිල් සිල්වා මහත්මයා ඒ නිලධාරියා පිළිබඳව මට දීර්ඝ විස්තරයක් කළා. බොහොම ශෝකානුකූලව ඒ නිලධාරියා කථා කරලා කිව්වා, "අපිත් එක්ක වැඩ කරපු ඉතාම හොඳ, අවංක, කාර්ය ශූර නිලධාරියෙක්, මේ සිද්ධියෙන් විශාල පාඩුවක් වුණේ කියලා. ඒ වාගේම එම නිලධාරියා ආර්ථික දුෂ්කරතා තිබෙන නිලධාරියෙක්. ඉස්කෝලේ යන වයසේ ගැහැණු දරුවන් දෙදෙනෙක් සිටින නිලධාරියෙක්. ඒ නිලධාරියාගේ පඩියෙන් තමයි ගෙදර මිනිස්සු ජීවත් වෙන්නේ. ඒ නිලධාරියාගේ ගෙවල් දොරවල් වලටත් අපි ගිහින් තිබෙන අවස්ථා තිබෙනවා සර්. ඒ නිසා ඒ අයට මොකක් හෝ සැලකීමක් කළ යුතුව තිබෙනවා. මළ ගෙදරවත් කර ගන්න පුළුවන් තත්ත්වයක් තියේවිද දන්නේ නැහැ. උදව් කරලා හැම දෙයක්ම සොයා බලා කරන්න වෙනවා. මට හරිම කනගාටුයි" කියලා කිව්වා. ඒ වගේ වේදනාත්මක ආකාරයෙන් එම නිලධාරියා පිළිබඳව විශාල තොරතුරක් කියලා තමයි මට විස්තර කිව්වෙ.

ප්‍ර: ඔබතුමා අවස්ථා ගණනකදී මාතර ASP ඔහන්මයාට, ඒ වාගේම DIG මහත්මයාට, නි.පො.ප. කට, ඒ වාගේම ජ්‍යෙ.නි.පො.ප. කට කථා කළා කිව්වා. මේ ඉල්ලුම් පත අත්සන් කරන්න ඉස්සෙල්ලා එම නිලධාරියාගේ මරණය හදිසි මරණයක්, ඒ හදිසි මරණය සම්බන්ධයෙන් ගරු අධිකරණයට කරුණු වාර්තා කළාද, නැද්ද කියන කාරණය තහවුරු කරලා දැන ගත්තාද?

උ: පැහැදිලිවම ස්වාමීනි, මේ ක්‍රියාවලිය සිදු වුණු අවස්ථාවේ ඉඳලා වැඩ බලන පොලිපතිවරයා හැටියට ඒ සම්බන්ධයෙන් වන දේවල් පිළිබඳව නිරන්තරයෙන් update වුණු නිලධාරියෙක් මම. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න මහෙස්ත්‍රාත්තුමා ආවාද, මහෙස්ත්‍රාත්තුමා පරීක්ෂණය ආරම්භ කළාද, ඔබලා සාක්ෂි මෙහෙයවනවාද. කවුද සාක්ෂි මෙහෙය වන්නේ, ඒ ආදී තොරතුරු සියල්ලම පිළිබඳ යථාවත් වුණු නිලධාරියෙක් මම. මේ සිද්ධිය වුණාට පස්සේ, නිලධාරියෙක් මිය ගියා, පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූවා, අධිකරණයට කරුණු වාර්තා කළා, එම නිලධාරියා බීමත්ව සිටියේ නැහැ, මේ ආදි කරුණු සියල්ල පිළිබඳවම යථාවත් වීමක් වුණා. මම හෝ කවරු හෝ පොලිස්පති වශයෙන් සිටින නිලධාරියෙක් මේ සම්බන්ධයෙන් අහක බලාගෙන ඉන්නේ නැහැ. මොකද, ඒ වෙලාවේ ප්‍රධාන වශයෙන්ම කථා කළේ ඒ සිදුවීම පිළිබඳව නිසා. එම සිදු වීම වුණු දවසේ වෙන දේකට වඩා මේ සිදුවීම ගැන තමයි කථා කළේ. මේ සියලු දේවල් සම්බන්ධයෙන් මම යථාවත් වෙලා සිටියේ.

ප්‍ර: ඔබතුමා මීට ඉස්සෙල්ලාත් මේක කිව්වා. නමුත්, මේක අතිශය වැදගත්. එම නිලධාරීන් පිටව යෑමට අදාළ අවුට් එකක් තිබෙනවාද, නැද්ද කියන කාරණය තහවුරු කර ගත්තාද?

උ: ස්වාමීනි, මම මීට කලිනුත් ප්‍රකාශයක් කළා. එදා උදේ නෙවිල් සිල්වා යන ගමන්ම කිව්වා කියලා ඔහු පහාමාරට CCD එකට ගිහිල්ලා බැලුවා නිත්‍යානුකූලව අවුට් එකක් දාලා තිබෙනවාද කියලා. ඒකේ උපුල්ගේ නම සඳහන් වෙනවා කියලා මට කථා කරලා කිව්වා.

It is relevant to note that according to the Respondent IGP he had even contacted the DIG Colombo in this regard. In his evidence, he has also proceeded to explain in detail the other occasions at which he was instrumental in ensuring the payment of rewards to the affected families without any undue delay.

Answering a question asked by his Counsel, the Respondent IGP has taken up the position that he did not take steps to pay rewards to the other officers namely: the others in the CCD team including SI Maduranga who received a gunshot on his leg; the officers of the Weligama police night patrol jeep; Police Sergeant Sisira Kumara who got off the jeep and walked towards the parked CCD van from which firing was seen happening; Army Sergeant Ruchiranga who opened fire at the escaping van. According to the Respondent IGP the reason for that was because no senior officer down the line had recommended a payment of any such reward to those officers.

The Respondent IGP, responding to a question his Counsel had asked, has admitted that he appointed a three-member committee comprising of DIG Colombo Jagath Chandra Kumara, SSP Colombo Central Division Leelaratne and OIC Colombo Fraud Bureau CI Balasuriya and obtained a recommendation from the said committee to grant a promotion to PS Upul

posthumously as a Sub-Inspector. It is his position that he is satisfied that the correct procedure was followed in granting the said promotion posthumously to PS Upul.

He has further stated that DIG Colombo Jagath Chandra Kumara had informed him over the phone, strongly recommending the payment of Rs. 1.5 million to the family of the killed PS Upul from the Police Reward Fund. The relevant question and answer in this regard is as follows:

ප්‍ර: ඔබතුමා දැන් කිව්වා, ඒ නිලධාරියාගේ ආර්ථික තත්ත්වය, ඒ නිලධාරියාගේ මුළු පවුලම යැපෙන්නේ ඒ නිලධාරියාගේ වැටුපෙන් විතරක් කියලා. දරුවෝ දෙදෙනෙක් ඉන්නවා කියලා. ඒ දියණියන් දෙදෙනෙක්ය කියලා. දියණියන් දෙදෙනා ඉස්කෝලේ යනවා කියලා. ඒ කරුණු ගැන කොයි වෙලාවක හරි ඒ මිය ගිය නිලධාරියා අදාළ වන පොලිස් වසමේ ස්ථානාධිපතිගෙන් කරුණු තහවුරු කර ගත්තාද? ඒ ගැන විස්තර සඳහන් කරන්න?

උ: චන්ද්‍රකුමාර, නියෝජ්‍ය පොලිස්පති, කොළඹ දිශාව ළඟට ඒ reward application එක ආවාට පස්සේ ඔහු මට දුරකථනයෙන් කථා කළා. කථා කරලා ඇහුවා, "මේ reward application එකට Directorගෙන් ඇවිල්ලා තිබෙනවා ලක්ෂ 15 ක් දාලා. මේක සාමාන්‍යයෙන් මීට කලිනුත් CCD එකේ කට්ටිය මැරුණාම පාස්කු ප්‍රහාරයේ කට්ටියක් අත්අඩංගුවට ගන්න ගිහිල්ලා තුන්දෙනෙක් මැරුණා එක දවසේ. තුන්දෙනාටම ලක්ෂ 15, 15 දීලා තිබෙනවා. ඒ නිසා වෙන්න ඇති මේගොල්ලෝ මේක දාලා තිබෙන්නේ. මේක සම්බන්ධව මම හොයලා බැලුවා. මම ගලේවල OICට කියලා නිලධාරියෙක් ගෙදරට යවලා හොයලා බැලුවා ඇත්තටම ඒ මිනිසුන් ආර්ථික දුෂ්කරතා තිබෙනවාද කියලා. කථාව නම් ඔක්කෝම ඇත්ත සර්. මගේ අදහස නම් මේ ලක්ෂ 15 ඒ මිනිහාට දෙන එක සාධාරණයි. සර් මොකද හිතන්නේ" කියලා කථා කරලා මගෙන් ඇහුවා.

මම කිව්වා, "ඒ මිනිහාගේ කථාවත් ඇත්ත නම්, ඒ මනුෂ්‍යයාට ඔය වාගේ ආර්ථික දුෂ්කරතා තිබෙනවා නම්, ඒ මිනිහා හොඳ මිනිහෙක් නම්, රාජකාරියකට ගිහිල්ලා මැරිලා තිබෙන්නේ. මීට කලින් මිනිසුන්ටත් ලක්ෂ 15 ක් දීලා තිබෙනවා නම් ඔයාගේ නිර්දේශය ඔය එව්වොත්, මමත් ස්ථිර වශයෙන් ඕක අනුමත කරනවා ලක්ෂ 15 ක් දෙන එකට" කියලා මම කිව්වා.

The Respondent IGP has denied that he had influenced his junior officers to include a figure of Rs. 1.5 million in the reward application. It is his position that the process adopted in the payment of the reward of Rs. 1.5 million to the killed PS Upul was perfectly in order.

Referring to the offer by the Cricket Board to him to join as a security consultant, the Respondent IGP while admitting that there was such an offer, has stated in his evidence that he refused to accept the same by sending a written letter. He denies that there was any connection between this and the person known as Jamaldeen who is said to be the owner of

W15 hotel. Similarly, he also denies that he has any involvement in the incident regarding the dispute pertaining to a land situated on Darley Road, Colombo. In his evidence, the Respondent IGP has stated that he did not have any animosity against the owner of W15 hotel.

Referring to the evidence of police officers who stated before the Committee about the alteration of number of registers maintained in the relevant offices, it is the position of the Respondent IGP that it is the relevant officers in charge of those offices who must take the responsibility for those actions of unlawful alterations of relevant registers. It is to be noted that the Respondent IGP had not sought to challenge the veracity of the evidence of those police officers who testified before the Committee explaining how they were forced to alter the respective registers. His position with regard to the evidence of those police officers is limited to the assertion that these alterations were not carried out at his command.

The Respondent IGP has also stated that DIG Nishantha de Zoysa's assertion that it was SI Priyankara who supplied to him on 30-12-2023, the photographs and video clips of W15 hotel is false. He also denies that he sought information about W15 hotel from DIG Nishantha de Zoysa.

Towards the end of his examination-in-chief, the Respondent IGP has stated as follows:

ප්‍ර: ඔබ කොයි වෙලාවක හරි සක්‍රිය විධියට හෝ නිශ්ක්‍රිය විධියට හෝ කිව්වාද, ඩබ්ලිව් 15 එකට වෙඩි තියන්න කියලා?

උ: කිසිසේත්ම නැහැ.

ප්‍ර: ඔබ කොයි වෙලාවක හෝ ඔය යන ගමනේ නිලධාරින්ට ආයුධ අරගෙන යන්න කියලා කිව්වාද?

උ: මම කිව්වේ නැහැ. නමුත් ප්‍රමාණවත් ආරක්ෂාව සලසා ගෙන යන්න කියලා එයාලගේ ඩිරෙක්ටර් කියා තිබෙන බව ඒ අය ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව තමයි ඔවුන් ආයුධ අරගෙන ගිහින් තිබෙන්නේ.

ප්‍ර: එහෙම ආයුධ අරගෙන ගියා කියන එක ඔබ දැනගෙන හිටියාද?

උ: නැහැ. මම පසුව දැන ගත්තා.

ප්‍ර: යන්න ඉස්සෙල්ලා දැනගෙන හිටියාද?

උ: යන්න ඉස්සෙල්ලා දැනගෙන හිටියේ නැහැ.

He has also described an incident in which Acting Director CCD ASP Neville de Silva had resisted an illegal order given to him by DIG Nishantha de Zoysa at that time.

The Respondent IGP in the conclusion of his evidence-in-chief, has denied the charges levelled against him and stated as follows:

ප්‍ර: ඔබතුමාට වෙන මොනවා හෝ මේ උතුම් වූ පරීක්ෂණ කමිටුවට කියන්න තිබෙනවා නම්, අවසාන වශයෙන් කියන්න?

උ: ස්වාමීනි, මම කලිනුත් ප්‍රකාශ කළා වාගේ, මම මේක සලකන්නේ, කාගේ හෝ වුවමනාවකට, ඒක දේශපාලන වුවමනාවක් වෙන්නත් පුළුවන්, හැබැයි දේශපාලන වුවමනාවකටත් වඩා පුද්ගලයින් කිහිපදෙනෙක් සම්බන්ධයෙන් මගේ අදහසක් තිබෙනවා. ඒක මම ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. තමා විසින් නිර්මාණය කර ගත් පෙත්සමකට, තමන්ට ඕනෑ ආයතනයකට දාලා, තමන්ට ඕනෑ විධියට සාක්ෂි හදාගෙන කරපු inquiry එකක් විතරයි. නිශාන්ත සොයිසා මහත්මයා කරලා තිබෙන මේ අසත්‍ය ප්‍රකාශය හැරුණු විට මට විරුද්ධව, මගේ වුවමනාවට මේක වුණා කියන එක සම්බන්ධයෙන් කිසිම සාක්ෂියක් හෙළිදරව් වුණේ නැහැ ස්වාමීනි. මම මෙතැන වාඩිවෙලා පසුගිය දවස් වල අහගෙන සිටියා. CID එක පවත්වපු විමර්ශනයේදීත්, මම උපදෙස් දීලා ගිහින් මේක කෙරෙව්වා කියලා පරිවේෂණීය සාක්ෂියක්වත්, වෙන සාක්ෂියක්වත්, කිසි දෙයක් හෙළිදරව් වෙලා නැහැ ස්වාමීනි. එහෙම අවස්ථාවක මම මේ රටේ නාමිකව පොලිස්පති වශයෙන් ඉන්නකොට මාව අත් අඩංගුවට අරගෙන, අනික් මිනිස්සු ඔක්කොටම රිට් අයදුම්පතක් මඟින් අත් අඩංගුවට ගැනීම වළක්වා තිබුණු අවස්ථාවක, උසාවියෙන් දවස් 20ක් රක්ෂිත බන්ධනාගාරගත කළා ස්වාමීනි. ඒ දවස් 20 ඇතුළත මම කිසිම වරප්‍රසාදයක් ඉල්ලුවේ නැහැ. සාමාන්‍යයෙන් මට නිදාගන්න මෙට්ටයක් හෝ ඉල්ලීමේ හැකියාව තිබුණා. මම ඒ කිසිම දෙයක් ඉල්ලන්නේ නැතුව ගත කළා. මොකද, හේතුව ඒ දීපු අයුක්ති සහගත තීන්දුව නිසා මට වෙච්ච අගතිය සම්බන්ධයෙන් මා තුළ තිබුණු දැඩි මානසික පීඩාව නිසා මම එහෙම කළේ. මොකද, හේතුව කවදාහරි දවසක මේකෙන් මට යුක්තියක් ඉෂ්ට වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මට විරුද්ධව කිසිම සාක්ෂියක් ඉදිරිපත් වෙලා නැහැ. ඒ නිසා මට අවසන් වශයෙන් කියන්න තිබෙන්නේ, ඔබතුමා පිළිබඳව තිබෙන විශ්වාසය සහ ඔබතුමා වාගේම අනෙක් විනිසුරුතුමන්ලා දෙදෙනා ගැන තිබෙන විශ්වාසය නිසා තමයි අපි තීරණය කළේ මේ පරීක්ෂණයට සහභාගි වෙන්න. එහෙම නැත්නම් ඕනෑ තීන්දුවක් ගන්න කියලා ස්වාමීනි, මට මේකට පෙනී සිටින්නේ නැතිව ඉන්න තීරණයත් ගන්න තිබුණා. නමුත්, මම තීරණය කළා ඔබතුමා ඉස්සරහට ඇවිල්ලා අපේ පැත්තෙන් කරුණු කාරණා කියනවා කියලා. ඔබතුමා මොන තීන්දුවක් දුන්නත්, අපි ඒ තීන්දුව හිස නවා පිළිගන්නවා. නමුත්, මේක ඉතිහාසගත වෙනවා. පොලීසියේ ඉතිහාසය අවුරුදු 158යි. පළමුවැනි වතාවට මේ Act එක යටතේ ඇවිල්ලා පොලිස්පතිවරයෙක් සම්බන්ධයෙන් ක්‍රියා කරන අවස්ථාවක් මේක. මේක ඉතිහාසගත වෙනවා. ඉතිහාසගතවෙනවා වාගේම ඉදිරි කාලයේදී ඒ සම්බන්ධව මිනිස්සු

ගොඩක් දේවල් කථා කරයි. ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ, කරුණාකර මේ එළඹුණු සාක්ෂි එක්ක බලලා ඔබතුමාගේ අභිමතය පරිදි සුදුසු තීන්දුවක් ලබා දෙන්න කියලා.

(24) Cross-examination of the Respondent IGP by the learned Additional Solicitor General.

The learned Additional Solicitor General has cross-examined the Respondent IGP on several material points. In the course of the said cross-examination, the learned Additional Solicitor General has established (from the answers the Respondent IGP has given during the cross-examination), that the Respondent IGP had only taken out checking details/apprehension of 149 persons listed in **R-2** and assigned only that task to the Acting Director CCD ASP Neville de Silva. The Respondent IGP though has taken the view that he was not satisfied with the progress made by the CID with regard to the investigations carried out to curb the narcotics distribution network operated by *Harak Kata*, has not taken any step/remedial action against the alleged errant CID officers. This is important as it is the evidence of the Respondent IGP that he decided to assign the above task to the CCD Acting Director on the basis of the CID officers' lethargy or their involvement in corrupt activities which he thought favoured *Harak Kata's* organized crimes.

The Respondent IGP in several places during his cross-examination, has taken up a clear position that the CID nevertheless did proceed with the main investigation against *Harak Kata's* dealings in the organized crimes. He has also specifically stated that the only aim he sought to achieve by assigning **R-2** to the Acting Director CCD ASP Neville de Silva, is to ensure the destruction of the narcotics distribution network operated by *Harak Kata* in the Southern Province. The Respondent IGP's assertion is that this operation was centered and focused on the people whose addresses were found in Weligama area and its suburbs only. That is why the Respondent IGP has stated that he expected ASP Neville de Silva to continue to send teams daily to Weligama area until they finish probing into the details of all of them in the list attached to **R-2**.

Evidence has revealed that IP Jayatilleke's team from the CCD was the first team which went to Matara area on 29-12-2023. The CCD team led by CI Anslem de Silva which left in the night on 30-12-2023 is the second team. While the first team is reported to have arrested 11 persons, the second team has not done anything on the persons listed in **R-2**. The Respondent IGP has admitted that the CCD did not do anything after this shooting on 31-12-2023. The Respondent IGP's explanation for the CCD's failure to carry on with the instructions he has

consciously given to ASP Neville de Silva with a huge interest and vigour is reflected in the following two excerpts:

ප්‍ර: හැබැයි ඒ මෙහෙයුම ඉවර වුණේ නැහැ?

උ: බැරි වුණානේ මෙක නිසා. මේ සිද්ධියෙන් පස්සේ ඒක කඩාකප්පල් වෙලා ගියා ස්වාමීනි.

ප්‍ර: මට තේරෙන්නේ නැත්තේ ඒක කඩාකප්පල් වුණේ කොහොමද පොලිස්පතිතුමා?

උ: ස්වාමීනි, 29 වෙනි දා ගිය කණ්ඩායම මේකෙන් 11දෙනෙක් අත්අඩංගුවට ගෙන ගෙනාවා. 30 වෙනි දා ගිය කණ්ඩායම මේ කියපු රාජකාරියට යනවා කියලා පිටවෙලා ගිහින්, වෙන සිද්දියක් එතැන සිද්ධ වුණා. ඊට පස්සේ නිලධාරියෙක් මැරුණා. ඊට පස්සේ සිසිඩී එකට පවරපු ජොබ් එක එතැනින් ඇත්ත වශයෙන් කඩාකප්පල් වෙලා ගියා. මේ සිද්ධිය නොවෙන්න ස්ථිර වශයෙන්ම, - 31 වෙනි දා, ජනවාරි 01 වෙනි දා ආදී වශයෙන් මාසයක් විතර ඇතුළත මේ 149 දෙනා ඉවර කරලා දෙන්න කියලා මම කිවේ - ඒක කෙරනවා. නමුත් මේ අනපේක්ෂිත සිද්ධිය නිසා ඒ වැඩේ නතර වුණා කියන එක තමයි මම කියන්නේ.

ප්‍ර: ඒ කියන්නේ CCD එකෙන් 30වෙනි දා ගිය කණ්ඩායම් කළ වැඩේ නිසාද කඩාකප්පල් වුණේ?

උ: ඔව් ස්වාමීනි. ඒකේ ගිය නිලධාරියෙක් මැරුණාට පස්සේ ඒ වැඩේ තවදුරටත් සිසිඩී එකෙන් නොකෙරෙන තත්ත්වයට පත් වුණා. ඊට පස්සේ කණ්ඩායම් මේ සඳහා යැවීමක් වෙලා නැහැ.

....

ප්‍ර: සාක්ෂිකරු කිව්වා, මෙම සිද්ධියෙන් පස්සේ මේ වැටලීම් නැවතුණා කියලා?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: මම අහන්නේ, මෙම සිද්ධිය ශක්තියක් කරගෙන full force එකෙන් ගහන්න ඕනෑ නැද්ද පාතාලයට?

උ: එසේ ගැසිය යුතුව තිබෙනවා, ස්වාමීනි. නමුත්, කරුණු කාරණා යෙදිච්ච ආකාරය අනුව, විශේෂයෙන්ම මේකට CID එක දිගටම යොදවලා නිශ්චිත result එක ගන්න බැරි නිසයි CCD එක දැම්මේ කියලා මම කලින් අවස්ථාවේ ප්‍රකාශ කළා. ඒකට දාපු CCD එකේ team එක ගිහිල්ලා මේ වාගේ සිද්ධියක් ඇති වුණා. එතකොට ප්‍රායෝගිකව එතැනදී පොලිස් නිලධාරියෙකුත් මැරුණා. ඊට පස්සේ ප්‍රායෝගිකව ඇති වෙච්ච පසුබැස්ම නිසා නැවත වතාවක්, - ඒක අනිවාර්යයෙන්ම කළ යුතුව තිබුණා. නමුත්, ඒ සිදුවීමෙන් වූ පසුබැමත් එක්ක ඒ කර්තව්‍ය සඳහා නැවත වතාවක් අඛණ්ඩව teams යෙදවීම කඩාකප්පල් වෙලා තිබෙනවා.

<u>පරීක්ෂණ කොමිටුවෙන්:</u>

ප්‍ර: මේ වාගේ සිද්ධියක් ඇති වුණා කියන එකෙන් සාක්ෂිකරු අදහස් කරන්නේ CCD එකේ නිලධාරීන් වැරදි වැඩක් කළා කියලාද?

උ: නැහැ. CCD එකේ නිලධාරීන් නීත්‍යානුකූලව රාජකාරි කරන්න ගිය වෙලාවේ වෙච්ච වෙඩි තැබීමකින් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදී එක් නිලධාරියෙකු මියයෑම සහ අනෙක් නිලධාරියාට තුවාල සිදු වීම. අන්න ඒ නිසා CCD එකෙන් teams මේකට අඛණ්ඩව දාන්න කියපු වැඩ පිළිවෙළ එතැනින් කඩාකප්පල් වුණා; පසුබෑමකට ලක් වුණා කියන එක තමයි මම අදහස් කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ තුන්වැනි පාර්ශ්වයකින් වෙඩි තියපු එක ගැන?

උ: තුන්වැනි පාර්ශ්වයකින් හෝ කවුරු හරි තියපු වෙඩි පහරකින් එක් නිලධාරියෙක් මැරිලා, තවත් නිලධාරියෙක් තුවාල වීමෙන් පස්සේ මේ වැඩේ ඇනහිටියා කියන එක තමයි මම කියන්නේ.

***

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරන්නේ ඇනහිටින්න නොවෙයි, ඒක තව ශක්තියක් කර ගන්න තිබුණා කියන එකයි. සාක්ෂිකරු ලස්සන වචනයක් කිව්වා, අපරාධකරුවන් තුළ, පාතාලය තුළ මානසික භීෂණයක් ඇති කරන්න,- සාක්ෂිකරුට දැනෙන විධියට මෙම සිදුවීමේදී අසාධාරණ චෝදනාවක් නේ මුලින්ම ආවේ. ඒ කියන්නේ, W15 හෝටලයට කොන්ත්‍රාත් එකකට ගිහින් වෙඩි තිබ්බා වාගේ කථාවක් සමාජගත කරලා, ඊට වඩා වැඩි මෙහෙවරක් නැවත්වුවා කියන එකනේ පෙනී යන්නේ. නමුත්, සාක්ෂිකරු ඒකෙන් ශක්තියක් අරගෙන අඩුම තරමේ මේ ප්‍රහාරකයෝ හොයන්න යම්කිසි මෙහෙවරක් කරන්න ඒ නිලධාරීන්ට වග කීමක් නැද්ද? සාක්ෂිකරුට නොවෙයි මම අහන්නේ. ඒ ප්‍රදේශයේ නිලධාරීන්ට හරි වගකීමක් නැද්ද?

උ: අනිවාර්යයෙන්ම මට මේ සිද්ධිය සැල කරපු වේලාවේ ඉඳලාම මම දීපු මූලිකම instruction එකක් තමයි මේ CCD එකට වෙඩි තිබ්බේ කවුද කියලා හොයන්න කියන එක. කවුරු හරි වෙඩි තිබ්බා නම් හොයන්න. එහෙම කවුරු හරි වෙඩි තිබ්බේ නැත්නම් ඒක clear-cut ඇවිල්ලා වෙඩි තියලා නැහැ කියලා report කරන්න ඕනෑ. ඒ දෙකෙන් එකක් ගත්තා නම් මෙතැනදී තීන්දුවකට එන්න තිබුණා. මම ඉස්සෙල්ලා පැහැදිලි කළා වාගේ මේ සම්බන්ධයෙන් විර්මශනයක් මාතර පොලිස් කොට්ඨාසයෙන් වුණා. ඒ අය අවසාන වශයෙනුත් තීන්දුවකට ඇවිල්ලා නැහැ, තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබ්බේ නැහැ කියලා. නමුත්, තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබ්බා කියලා සනාථ කර ගන්න සාක්ෂියකුත් හම්බ වෙලා නැහැ. අදටත් ඒක නොවිසඳුණු තත්ත්වයේ තිබෙන ප්‍රශ්නයක්. ....."

The Respondent IGP did not even mention the fact that it was the officers in the Weligama police night mobile patrol who had given statements to the Weligama OIC Crimes first. This was at 6.00 am at the scene of the crime itself on 31-12-2023. Nevertheless, it is the consistent position of the Respondent IGP right throughout this Inquiry, that an unknown gunman had

opened fire at the CCD officers when they had wanted to check the purported suspected person. It is also the position of the Respondent IGP that the CCD officers in the van came under fire and the suspected person fled. According to the Respondent IGP, it is at that occasion that SI Maduranga in the CCD van had opened fire at the direction where the fire targeting the CCD officers came from. This is the view taken by the Respondent IGP even at present. The primary question which arose to the Committee of Inquiry is as to why the Respondent IGP is still interested in maincaining that view.

He as the Inspector General of Police was discharging functions of the office of the Inspector General of Police until 24-07-2024. At present, he has been restrained by the Supreme Court from discharging the functions of the office of the Inspector General of Police. He was not present at the scene of the crime when the incident took place. He never went in the CCD van with CI Anslem de Silva and the team. He did not go to Weligama police station or to the scene of the crime even after the incident.

After some time, the CID took over the investigation. The learned Magistrate of Matara came to a conclusion that the CCD team's SI Maduranga had opened fire at W15 hotel deliberately without any justification. The learned Magistrate, in his Order dated 27-02-2025, for the reasons set out in that Order has concluded that such a firing by an unknown gunman is a false assertion and an event which had not factually happened. Officers who were in Weligama police night mobile patrol jeep made statements to OIC Crimes Weligama at 06.00 am at the scene of crime itself on 31-12-2023 stating the true incident. The Respondent IGP does not challenge that evidence. Thereafter, after analysis of the empty cases of cartridges which are said to have been found at the scene by SOCO officers, the Government Analyst has submitted a report (**P-11**) confirming that all empty cases of cartridges found there, have been fired by the same weapon. The Respondent IGP still does not have any interest to take those matters into consideration. Nevertheless, the Respondent IGP is a Police officer who has received higher education with regard to the scope of his duties in the Police, in countries such as Russia, China, South Korea, India and Thailand and a Police officer who has received training regarding the crime investigation in Scotland Yard in Great Britain. In view of all the aforementioned matters, the Committee of Inquiry takes the view that the facts, circumstances and the common course of natural events relating to this incident do not at all support the view/position, the Respondent IGP still seeks to maintains.

Thus, the Committee of Inquiry is unable to accept the Respondent IGP's evidence that the incident of shooting took place in front of W15 hotel in Weligama had happened in the way

the Respondent IGP has attempted to assert before this Committee. It is the view of the Committee of Inquiry that there is no basis whatsoever upon which the Respondent IGP could or should have concluded that this shooting incident had happened in the way CI Anslem de Silva and the other members of his team had claimed in their first set of statements to Weligama police station and their evidence at the inquest. Indeed, it is a fact that even the learned Magistrate of Matara had not accepted the evidence of the CCD team members when he arrived at his conclusion in his Order dated 27-02-2025.

The Respondent IGP consistently stated before this Committee that one cannot exclude the possibility that there was indeed firing by an unknown gunman at the CCD van in front of W15 hotel as the investigations were continuing. However, he himself has stated clearly that he is not aware as to what progress the investigation carried out by Weligama police station had achieved. Indeed, CI Karunathilleke of the CID who has given evidence before this Committee has clearly stated that the investigation carried out by Weligama police station had not proceeded thereafter. It is a fact that the HQI Weligama police station at present stands accused before the Magistrate's Court of Matara for concealing evidence pertaining to this incident.

When confronted as to why the CCD team could not have come forward and identify themselves to the members of Weligama police night mobile patrol, the Respondent IGP has admitted that the CCD team members should have done so. He has also admitted that there is no lapse on the part of Weligama police night mobile patrol in that regard. The Respondent IGP has also admitted that at least one of the members of the CCD team should have been in uniform at that occasion according to the circulars issued by Inspector General of Police. He has admitted that failure too on the part of CCD officers (i.e., the failure for at lest one CCD officer to be in uniform).

His view on the actions of the CCD speeding away to escape when the Weligama police night mobile patrol came at the time of shooting is reflected in the following excerpt:

ප්‍ර: සභාපතිතුමාට වැඩිය මම පියවරක් ඉදිරියට ගොස් ප්‍රශ්නය අහනවා. තුන්වැනි පාර්ශ්වයක් කොළඹින් ගිය කණ්ඩායමකට පාර අයිනේ ඉඳන් වෙඩි තිබ්බා නම් වැලිගම කණ්ඩායමක් එකතු කළා නම් ප්‍රහාරකයාට ප්‍රහාරයක් දෙන්න තිබුණේ නැද්ද?

උ: ඇත්ත වශයෙන්ම එසේ කිරීමට ද හැකියාවක් තිබුණා. මොවුන් ප්‍රකාශ කර තිබෙන ආකාරයට ජීප් එක එන අවස්ථාවේ පාර හරස් කරපු වෙලාවේ ඔබ කියනවා වාගේ වැලිගම පොලිසියේ ජීප් එකට ගිහිල්ලා කථා කරලා අපට මෙහෙම සිද්ධියක් වුණා. ඒකයි අපි වෙඩි තිබ්බේ.

දෙපැත්තම එකතු වෙලා අර මිනිහා අල්ලා ගන්න ක්‍රියා කරමු කියලා කටයුතු කිරීමේ අවස්ථාවක් තිබුණා.

ප්‍ර: ඒ විතරක් නොවෙයි, තව එස්.ටී.එෆ්. බස් එකක් තිබුණා, පොඩ්ඩක් එහා. ඒ ගොල්ලන්ගෙනුත් support එකක් ගන්න තිබුණා?

උ: ඒ ගොල්ලන් එහෙම කියලා තිබෙනවා. එහෙම තිබුණා නම් ඒ අයගේ support එක ගැනීමේ හැකියාව තිබුණා.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඒ වෙලාවේ ආවේ වැලිගම පොලීසියේ නයිට් මොබයිල් එක නේ. නයිට් මොබයිල් එක යන්නේ සිද්ධියක් සිද්ධ වෙලා කියලා දැන ගෙන ඒක විමර්ශනය කරන්න නොවෙයි නේ?

උ: මේක වෙන වැඩකට ගිහිල්ලා එන එකක්. මෙතැනදී අහම්බෙන් සෙට් වෙච්ච එකක් නේ, ස්වාමීනි.

ප්‍ර: නයිට් මොබයිල් එක සිද්ධියක් වුණත් නොවුණත් සංචාරය කරනවා?

උ: එහෙමයි.

ප්‍ර: පාරේ තිබෙනවා?

උ: ඔව්.

ප්‍ර: ඒක තමයි නයිට් මොබයිල් එක කියන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: සිද්ධියක් වන නොවන එක වෙන එකක්?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: ඒ වාගේ වෙඩි තැබීමක් සිද්ධ වුණොත් ඒ ගොල්ලෝ යන පාරේ ඒක අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන්ගේ විෂය පථයට වැටෙනවා නේ?

උ: අනිවාර්යයෙන්ම විෂය පථයට වැටෙනවා. ඒ ගොල්ලන්ගේ ඇස් ඉදිරිපිට ඒ වාගේ දෙයක් සිදු වුණා නම් ඒ ගොල්ලෝ අනිවාර්යයෙන්ම මැදිහත් වෙන්න ඕනෑ, ස්වාමීනි.

ප්‍ර: ඒ බව CCD එකේ අය නොදැන ගන්න හේතුවක් නැහැ නේ?

උ: එතැන හිටපු නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වයයි, ඒ ගොල්ලන්ගේ අත් දැකීම් එක්ක ඒක ඒ ගොල්ලෝ නොදැන ගන්න විධියක් නැහැ, ස්වාමීනි.

ප්‍ර: එහෙම නම් ඒ ගොල්ලන් අනිවාර්යයෙන්ම කළ යුතුව තිබුණේ මොබයිල් එකේ සහය පැතීම.

උ: අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන්ගේ සහාය ලබා ගැනීමට ඒ අය කටයුතු කළ යුතුව තිබුණා.

Moreover, the unjustifiable and abrupt end of the mission the Respondent IGP had assigned to ASP Neville de Silva is clear from the following questions and answers:

ප්‍ර: ඒක මර්දනය කරන්න යවපු නිලධාරීන්ට දැන් ඔය හරියට ගියේ ඔය විමර්ශනයට අදාළ සැකකරුවන් හොයන්න නේ ඔය හරියේ සංචාරය කළේ?

උ: එහෙම කියලා නේ ලියලා ගිහින් තිබෙන්නේ.

ප්‍ර: එහෙම ගියාම සංවිධානාත්මක අපරාධ කරුවන්ගෙන් කියලා විශ්වාස කරන්න පුළුවන් වෙඩි තැබීමකට ලක් වෙලා පොලිස් නිලධාරීන් මිය ගියාම ඒක භයානක තත්ත්වයක් කියලා මහත්මයා පිළිගන්නවාද?

උ: ඔව්. ඔවුන් කියපු විධියටත් පාතලයේ ඒ ලිස්ට් එකේ මිනිසුන් අල්ලන්න ගියාම පාතාලයේ මිනිහෙක් වෙඩි තියලා පොලිස් නිලධාරියෙක් මැරුණා නම් ඒක බරපතළ තත්ත්වයක්, ස්වාමීනි.

ප්‍ර: ඒක බරපතළ තත්ත්වයක්. මොකද, වෙඩි තියපු මිනිහාත් හොයා ගන්න නැහැ?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: එතකොට පාතලයේ හෝ නාදුනන තුවක්කුකරුවෙක් හෝ රාජකාරියට ගිය පොලිස් නිලධාරියෙක් වෙඩි තබා ඝාතනය කරනවා කියන්නේ බරපතළ තත්ත්වයක්?

උ: ඔව්.

ප්‍ර: ඒක නිසා දැන් මහත්මයා කියන විධියට සම්පූර්ණයෙන්ම විමර්ශන සංවිධානය කඩාගෙන වැටුණා?

උ: ඔව්. ඒක මම ආයේ කරන්න අත ගැහුවා නම් අනිවාර්යයෙන්ම- මට ඒක කරන්න බැරුව ගියා. STF එක වාගේ එකක් එක්ක combined කරලා තමයි ඊළඟ සැරේ කරනවා නම් කරන්න වෙන්නේ. මොකද, threat එකක් තිබුණා ඒ level එකත් එක්ක. මොකද හේතුව ස්වාමීනි, underworld එකේ මිනිහෙක් වෙඩි තිබ්බා කියලා ඒ ගොල්ලෝ කිව්වා නේ කථා කරලා. එහෙම එකක් වෙලා නැහැ පලයල්ලා භය නැතුව කියලා තව කණ්ඩායමක් මට යවන්න පුළුවන් වාතාවරණයක් තිබුණේ නැහැ. මොකද, නිලධාරීන්ගේ ජීවිත නැති වුණොත් ඒක වග කීමක් වනවා නේ.

ප්‍ර: ඒක ඇත්ත වශයෙන්ම සංවිධානාත්මක අපරාධකාරයෝ වෙඩි තියලා ඒ වෙඩිල්ලකින් පොලිස් සැරයන් උපුල්ව ඝාතනය කළා නම් ඒ හේතුවෙන් ඔය විමර්ශන සංවිධානය ඔබතුමා කරන්න

පටන් ගත්ත කර්තව්‍ය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා නම් සංවිධානාත්මක අපරාධකාරයෝ ජයග්‍රහණය කරලා තිබෙනවා?

උ: ඔව්, ඒ ලැයිස්තුවේ කට්ටිය අල්ලන එක break වුණා එතැනින්. නමුත්, යුක්තියේ මෙහෙයුම මත්ද්‍රව්‍ය වැටලීම් කරන එක අපි නතර කළේ නැහැ. මාතර ප්‍රදේශයේ වැඩ නැවැත්වූයේත් නැහැ. නමුත්, මේ ලිස්ට් එක ඔස්සේ මිනිසුන් අත්අඩංගුවට ගැනීම break වුණා. එය මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට ලැබිච්ච ජයග්‍රහණයක් විධියට සලකන්න පුළුවන්.

ප්‍ර: එහෙම බැලුවාම හරක්කටාගේ ජාලය සම්බන්ධව කරන විමර්ශනය පවත්වාගෙන යන්න කලින් ඒ වෙඩි තියපු එක ගැන විමර්ශනය කරලා මොකක් හරි කරන්න ඕනෑ?

උ: අනිවාර්යයෙන්ම කවුරු හරි මිනිහෙක් වෙඩි තියලාද, එහෙම නැත්නම් මිනිහා තිබ්බේ නැහැ කියන කථාව ඇත්ත ද කියන එක තහවුරු කර ගත යුතු වනවා.

When the learned Additional Solicitor General confronted the Respondent IGP with the evidence of the police officers who were on duty at Imaduwa Highway Entrance, when the CCD van came there after the shooting incident, the Respondent IGP has admitted the fact that the CCD team members had failed to divulge to the Police officers at Highway entrance that there were two police officers with gunshot injuries inside the van and in particular their failure to divulge the fact that one of the injured was in critical condition, is a questionable conduct on the part of the members of the CCD team. Furthermore, the Respondent IGP has clearly stated that the conduct of the police officers on duty at Imaduwa Highway Entrance who gave evidence before this Committee of Inquiry is not questionable. The Respondent IGP has stated that he never instructed the CCD officers to go to Weligama without informing the local police authorities.

Regarding the approval granted by him for the payment of the reward to PS Upul of the CCD who was killed in the shooting incident, the Respondent IGP even at present takes the view that there was nothing wrong in rewarding PS Upul of the CCD who was killed in this shooting incident. This is reflected in the following question and answer:

ප්‍ර: අවුරුදු එකහමාරකට පස්සේ ඒ දෙස බලනකොට මේ නිලධාරින්ගේ ක්‍රියාකාරිත්වය ගැන ප්‍රශ්න සහගත බවක් පේන්නේ නැත්ද?

උ: මට නවම එහෙම පේන්නේ නැහැ. එයට හේතුව වශයෙන් අද උදෙන් මම කරුණු දැක්වුවා. ඔවුන් දැනට සිටින තත්ත්වයත් ඉදිරියේදී නැවත වෙනස් කරයි කියලා දැඩි විශ්වාසයක් මට තිබෙනවා.

When the learned Additional Solicitor General asked the Respondent IGP as to why no steps were taken to reward either the Weligama police officers in the night mobile patrol or the other members of the CCD, the position taken up by the Respondent IGP is that there was no such application initiated by those down the line of command. At another point, the Respondent IGP has taken the position that such payments could not have been made as there was no final conclusion as to the legality or illegality of the actions of the police officers involved in the incident. When confronted as to why then the reward was approved for PS Upul of the CCD only, the Respondent IGP has failed to give any distinction/explanation acceptable to the Committee of Inquiry. This position is reflected by the following excerpt reproduced from his evidence during the cross-examination:

උ: ඒවා විමර්ශනයට භාජනය වෙනවා ස්වාමීනි. ඒ ප්‍රශ්නගත අවස්ථාවල් විමර්ශනයට භාජනය වෙලා, ක්ලියර් එකක්, තීරණයක් ඇවිල්ලා ඒ ඉන්ක්වයරි කරන කට්ටිය ගෙන්වලා මේ ගොල්ලන් මේ මේ කරුණු අනුව කියලා තිබෙන්නේ බොරු, මේක නොවෙයි මෙතැන වෙලා තිබෙන්නේ කියලා.

ප්‍ර: කවුද ඒවා විමර්ශනය කළේ?

උ: මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ පූර්ණ අධික්ෂණය යටතේ ASP වැලිගම තමයි ඔය ඉන්ක්වයරිය හැන්ඩල් කරලා තිබෙන්නේ.

***

ප්‍ර: දේශබන්ධු මහත්මයා, 31 වෙනකොට සම්පූර්ණ රාජ්‍ය යාන්ත්‍රණය සහ ඔබ දෙපාර්තමේන්තුව මිය ගිය උපුල් කියන නිලධාරියා පොලිස් දෙපාර්තමේන්තුවේ වීරයෙක් කරලා 3 වැනිදා වනකොට උසස් වීමකටත් නිර්දේශ වෙලා ඉවරයි?

උ: ඔව්.

ප්‍ර: නමුත්, ඒ හා සමගාමීව ඒකාබද්ධ යුද හමුදා පොලිස් කණ්ඩායමකුත් වැලිගම හිටියා, මේකට සම්බන්ධ වෙච්ච?

උ: 'යුක්තිය' මෙහෙයුම යටතේ ආවේ කියලා ඒ ගොල්ලන් කියලා තිබෙනවා.

ප්‍ර: ඔබතුමාගේ මෙහෙයුම යටතේ තව කට්ටියක් හිටියා?

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ අයට කිසි ඇගැයීමක් වුණේ නැහැ?

උ: ස්වාමීනි, ඔබතුමාට මම පැහැදිලිව කියන්න ඕනෑ. මියගිය නිලධාරියා කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව හිටපු නිලධාරියෙක්. ඔහු CCD commander හැටියට හිටපු නිලධාරියෙක්. ඒ නිසා එයාට මැරුණාට පස්සේ reward එකක් දීම initiate කරලා තිබෙනවා කියලා CCD එකේ OIC සහ director ඒ ක්‍රියාවලියේ, - වැලිගම පොලිසියේ නිලධාරින් අගයලා ඔහු හමුදා නිලධාරියෙකුටත් reward දෙන්න පුළුවන්. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙම initiate කරනවා නම් HQI වැලිගම ඒක initiate කරලා, ASP වැලිගම, SSP මාතර DIGලා හරහා මට ආවා නම් reward එකක් දෙන්න කියලා ඒ ගොල්ලන් කරලා තිබෙන ක්‍රියාවලිය යහපත් තත්ත්වයක් තිබුණා නම් මට ඒකටත් දෙන්න තිබුණා. නමුත්, මේකේ මැරුණු මනුස්සයාට හැර ඒ ගිය team එකේ අනෙක් මිනිස්සුන්ටවත් ඒ ගොල්ලන් යෝජනාවක් ගෙනැල්ලා නැහැ, reward එකක් දෙන්න කියලා.

ප්‍ර: ඒක තමයි. මම ඔබට යෝජනා කරන්නේ කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපතිගේ ක්‍රියා කලාපයම අස්වාභාවිකයි කියලා. මොකද, තුවාල වෙච්ච මිනිහාට ඉල්ලන්නේ නැහැ.

උ: ගරු ඔබතුමාගේ අවධානයට මම යොමු කරනවා, එදා reward application එකේ මේ මනුස්සයාට ලක්ෂ 15ක් දීලා ඇන්සලම් ද සිල්වා ඇතුළු අනෙක් කණ්ඩායමේ මිනිස්සුන්ටත් ලක්ෂ 5 ගානේ දුන්නේ නැත්තේ ඇයි කියලාද ඔබතුමා අහන්නේ.

ප්‍ර: දෙන්න ඕනෑ කියලායි මම කියන්නේ?

උ: ඇයි ඒ? අද ඔබතුමාම තර්ක කරනවා, අර මනුස්සයාට ලක්ෂ 15 ක් දුන් එක වැරදියි කියලා.

ප්‍ර: නැහැ. නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: මම හිතන්නේ, එතුමා ඒ ප්‍රශ්නය ඇහුවේ ඔබතුමාගේ ස්ථාවරය ඒක නම් මිය ගිය,?

උ: ඔහු මිය ගිය නිසා පමණයි ස්වාමීනි, ඔහුට ලක්ෂ 15 ක් දුන්නේ. මේ ප්‍රශ්නයට අදාළ විමර්ශනයක් යනවා, විමර්ශනයෙන් මොකක් හරි තීරණයක් එනකල් මේකට අදාළ කිසි කෙනෙකුට ගෙව්වේ නැහැ. උපුල් කියන නිලධාරියාත් මැරුණේ නැත්නම් එයාට මේ reward එක දෙන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔබතුමාටම සැකයක් තිබෙනවා. මියගිය කෙනාට ගෙවනවා, compensation-?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඔබතුමා කියනවා, අනෙක් තුවාල ලැබූ සහ වීර ක්‍රියාවක් කරපු කට්ටියට විමර්ශනයක් තියලා ගෙවන්න ඕනෑ කියලා. ඔබතුමා මියගිය අයටත් විමර්ශනයක් තියාගෙන මේකේ හරි වැරදි තෝරාගෙන ගෙව්වොත් හොඳයි කියන එක හිතුවේ නැද්ද?

උ: මම කිසිසේත් ඒ විධියට හිතන්නේ නැහැ, ස්වාමීනි. සිද්ධියකින් ඒ නිලධාරියා ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. ඒ ඉදිරිපත් වෙච්ච කරුණු කාරණාවල ඒ මැරුණු පුද්ගලයා වරදක් කළා කියලා කිසිම ආකාරයකින් සටහනක් වෙන්නේ නැහැ. කොළඹින් මෙගොල්ලන්ව වාහනයට දමාගෙන අරගෙන ගිහිල්ලා තිබෙන්නේ?

The reward has been approved and paid on the basis that PS Upul of the CCD was shot and killed by an unknown gunman when the CCD team had attempted to arrest him in front of W15 hotel. However, admittedly the Respondent IGP by 6.00 am on 31-12-2023 had got to know with certainty that PS Upul of the CCD and SI Maduranga received gunshot injuries from Army Sergeant Ruchiranga who fired from his T56 gun while being a member of the Weligama police night mobile patrol. When confronted with his two contradictory positions, the Respondent IGP had stated as follows:

ප්‍ර: P2 තැගි වවුචරයේ තිබෙන්නේ පොලිස් සැරයන් උපුල් කියන නිලධාරියා නාඳුනන තුවක්කුකරුවකුගේ වෙඩි පහරින් මිය ගියා කියලානේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒකේ සත්‍යතාවක් නැහැ නේ?

උ: ඒකේ සත්‍යතාව පිළිබඳ තවම නිලධාරීන් කථා කරලා කියලා තිබෙනවා මොබයිල් එකෙන් වෙඩි තියලා තමයි මේවා වුණේ කියලා. ඒකේ ගැටලු සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත්, අපට final තීරණයකට එන්න බැහැ. මොකද, නාඳුනන මිනිස්සු තිබ්බා කියන කාරණාව තවම නිෂේධ වෙලා නැහැ.

However, the Respondent IGP has admitted that the investigation carried out by the Weligama police station up until now has not confirmed any such position.

When further questioned, the Respondent IGP has reluctantly admitted that there was no conclusive finding as to which version is correct by 31-12-2023. The attitude and the interest taken by the Respondent IGP to lean on the version that there was firing by an unknown gunman and it is that firing which injured the CCD officers, could be seen from the following questions and answers recorded in the course of his evidence.

ප්‍ර: ඒක පැත්තකින් කියන්න. ඒක නොවෙයි. අපි තීරණය කරන්නේ මේකනේ. CCD එකෙන් මුලදී කියපු කතන්දරය විශ්වාස කරන්න, ඒගොල්ලන් කියපු ප්‍රකාශය හැර - ඇත්තටම ඔව්, ඒක එහෙම වෙන්න පුළුවන් කියලා හිතන්න වෙන බාහිර සාක්ෂියක් ස්වාධීන හෝ තහවුරු වෙන සාක්ෂියක් නැද්ද?

උ: ඒගොල්ලන් මුලින් කියපු කථාව පිළිගන්නත්, ඒ ගොල්ලන් කරන හුදු ප්‍රකාශ හැරෙන්න අපිට වෙන දේකුත් නැහැ. ඒ ගොල්ලන් දෙවැනියට කියපු ස්ථාවරයක් හරි කියලා පිළිගන්නත් ඒ ගොල්ලන් කියන කථාව හැර වෙන කථාවක් නැහැ. සාක්ෂියක් විධියට..

ප්‍ර: එතකොට ජංගම මුර සංචාරයේ යෙදුණු අයගේ ප්‍රකාශ?

උ: ජංගම මුර සංචාරයේ යෙදුණු අය කියන්නේ, - තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තැබුවාය කියන කථාව.

ප්‍ර: ඒ ගොල්ලන් කියන්නේ නැහැනේ? ජංගම මුර සංචාරයේ යෙදුණු කට්ටිය කියන්නේ නැහැනේ?

උ: නැහැ. ජංගම මුර සංචාරයේ යෙදුණු අය කියන්නේ නැහැ. ස්වාමීනි. මේගොල්ලන් කථා කරලා කිව්වානේ, අපට ඉස්සෙල්ලාම පාතාලයේ කට්ටියක් වෙඩි තිබ්බාය කිව්වානේ. ඒක එහෙම වුණා කියන්නත් සාක්ෂියක් නැහැ. නොවුණා කියන්නත් සාක්ෂියක් නැහැ, ස්වාමීනි.

ප්‍ර: එහෙම වුණාය කියලා සාක්ෂියක් නැහැ?

උ: නැහැ.

ප්‍ර: මම මේ කථා කරන්නේ අනිත් පැත්තට. ජංගම මුර සංචාරයේ කට්ටිය ඒ වෙලාවේම එතැනට ආපු කට්ටියක්.

උ: ඔව්.

ප්‍ර: ඒ ගොල්ලන් එහෙම එකක් කියන්නේ නැහැ?

උ: එහෙම එකක් කියන්නේත් නැහැ.

ප්‍ර: ඒ ගොල්ලත් මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යටතේ ඉන්නා කට්ටිය. HIQ මහත්තයා යටතේ ASP අරුණලාල් යටතේ ඉන්නා කට්ටිය?

උ: ඔව්.

ප්‍ර: ඒ ගොල්ලන් ඉස්සරවෙලාම එතැනට ආවේ?

උ: ඔව්.

ප්‍ර: ඒ විතරක් නොවෙයි, වෙඩි තිබ්බේ?

උ: ඔව්.

ප්‍ර: වෙඩි තිබ්බේ, වෙඩි තියමින් ඉන්නා කට්ටියකට? CCD එකේ කට්ටියට?

උ: ඒ ගොල්ලන් -

ප්‍ර: මොකද, නැද්ද?

උ: වීදුරුව ඇතුළෙන් වෙඩි තබන අවස්ථාවේ ගිනි පුපුරු යනවා කියලා දැක්කා. නමුත් වාහනය නතර කරන අවස්ථාවේදී වෙඩි තැබීම අවසන් වෙලා තිබුණා.

ප්‍ර: ඒක හරි. හැබැයි, වෙඩි තියමින් හිටියා දැක්කා?

උ: ඒගොල්ලන් දැක්කා කියලා කියනවා. ඒගොල්ලන්ගේ නිලධාරින් දැක්කා කියලා කියනවා.

ප්‍ර: සාක්ෂි හරිනේ එතකොට?

උ: ඔව්.

ප්‍ර: ඒ වෙඩි පහරවල් වැදිච්ච. කෙනෙක් හිටියේ නැහැ? CCD එකේ කට්ටිය තියපු වෙඩි පහරවල් වැදිච්ච මිනිහෙක් හිටියේ නැහැ?

උ: ඔව්. ඉතින් තුවාල වෙලාවත්. මැරිලාවත් නැහැනේ ඒ වෙලාවේ.

ප්‍ර: හැබැයි, වෙඩි පහරවල් හෝටලයට වැදිලා තිබෙනවා?

උ: ඔව්.

ප්‍ර: මිනිහෙක් අල්ලා ගෙන නැහැ. පැනලා ගියපු මිනිහෙක් පස්සේවත් අල්ලාගෙන නැහැ.

උ: ඔව්.

ප්‍ර: කවුරුවත් එහෙම දැකලාය කියන්නේත් නැහැ?

උ: සිසිටී එකෙන් වෙඩි තියලා තියනවා.

ප්‍ර: මොබයිල් එකේ කට්ටිය ඒක දැකලා තිබෙනවා?

උ: ඔව්. ස්වාමිනි.

ප්‍ර: වෙඩි වැදිලා හානි වෙලා තිබෙනවා, හෝටලයට?

උ: ඔව්. ස්වාමිනි.

ප්‍ර: ඒවායෙන් සාමාන්‍යයෙන් අදහස් වෙන්නේ නැද්ද, මොබයිල් එකේ team එක කියන එක වැඩිය වෙන්න පුළුවන් කියලා?

උ: එහෙම එකක් ස්වාමීනි, මට තීරණය කරන්න බැහැ. නමුත් ඒ මොබයිල් එකේ කියන කට්ටිය -

ප්‍ර: නැහැ, තීරණය කරන්න නොවෙයි.

උ: මොබයිල් එකේ කට්ටිය තියපු වෙඩි පහරවල් තමයි CCD එකේ වාහනයේ හිටපු මිනිස්සුන්ට වැදුණේ කියන කථාව පිළිගන්න පුළුවන්. CCD එකේ වාහනය ඇතුළේ හිටපු මිනිස්සුන්ට වැදුණේ මොබයිල් එකේ මිනිස්සු තියපු වෙඩි පහරවල් කියන එක විශ්වාස කරන්න පුළුවන්.

ප්‍ර: මම අහන්නේ මෙන්න මේ ප්‍රශ්නය. ඔය CCD එකේ කට්ටියත් පොලිස් නිලධාරින්.

උ: ඔව්.

ප්‍ර: මොබයිල් එකේ කට්ටියත් පොලිස් නිලධාරින්.

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: ඔය විමර්ශනය කරපු හෝ නොකරපු හෝ අයත් පොලිස් නිලධාරින්.

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: මහත්මයා, පොලිස්පති.

උ: ඔව්.

ප්‍ර: එවකට වැඩබලන පොලිස්පති.

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ අන්තිම බලධාරියා. ඊට ඉහළින් එක් කෙනෙක් නැහැනේ පොලීසියේ? එතකොට පොලීසියේ නිලධාරින් කොට්ඨාස දෙකක්, දෙකක් කියනවා.

උ: ඔව්.

ප්‍ර: එකකට එකක් විරුද්ධයි.

උ: එකකට එකක් විරුද්ධයි කියන මතයට ස්වාමීනි, - මොකද, මුල් අවස්ථාවේදී වැලිගම පොලීසියේ කට්ටිය CCD එකේ කට්ටියට නොහඳුනන පුද්ගලයෙක් වෙඩි තැබුවාය කියන ස්ථාවරය ප්‍රතික්ෂේප කර තිබුණේ නැහැ.

ප්‍ර: කවුද, ප්‍රතික්ෂේප කළේ නැත්තේ?

උ: වැලිගම පොලීසියේ කට්ටිය. වැලිගම පොලීසියේ මොබයිල් එකේ කට්ටිය අර මුල් අවස්ථාවේදී -

ප්‍ර: ඒ ගොල්ලන් එහෙම එකක් දැකලා නැහැ.

උ: ඒක තමයි. එහෙම එකක් දැකලා නැහැ. CCD එකේ කට්ටිය කිව්වා, මේ පැත්තට එල්ල කරලා වෙඩි තිබ්බා කියලා.

ප්‍ර: ඒක තමයි මම කියන්නේ. ඒ ගොල්ලන් එහෙම එකක් දැකලා නැහැ.

උ: දැකලා නැහැ කියලා පිළිගන්නවා.

ප්‍ර: ඒ ගොල්ලන් එහේම එකක් දැකලා නැත්නම් - මම මේ අහන ප්‍රශ්නය ගැන පොලිස්පතිතුමා විධියට හිතන්න.

උ: හරි.

ප්‍ර: CCD එකේ නිලධාරීන් කොළඹ ඉඳන් ඇවිල්ලා එක්කෝ හෝටලයට හෝ පැනලා ගියපු පුද්ගලයෙකුට හෝ කාට හෝ වෙඩි තියපු කට්ටිය.

උ: ඔව්.

ප්‍ර: බැලූ බැල්මට ඒ ගොල්ලන්ට හේතුවක් නැහැ.

උ: ඔව්.

ප්‍ර: වෙඩි තැබීමට හේතුවක් නැහැ.

උ: ඔව්.

ප්‍ර: ඒ වාගේම වෙඩි තියලා මැරිව්ව කෙනෙකුත් නැහැ.

උ: ඔව්.

ප්‍ර: මොබයිල් එකේ කට්ටිය - වැලිගම මොබයිල් එකේ කට්ටිය එහෙම නොවෙයි. ඒ ගොල්ලන් සම්පූර්ණයෙන්ම ස්වාධීන කණ්ඩායමක්.

උ: ඔව්.

ප්‍ර: ඒගොල්ලන් දන්නේ නැහැනේ, මෙතැන මොකක්ද කියලා. පොලීසියේ, CCD එකේ කට්ටියක් ඉන්නවා ද කියලා දන්නේත් නැහැ.

උ: එහෙමයි. ස්වාමිනි.

ප්‍ර: දන්නවා නම් වෙඩි තියන්නේ නැහැනේ.

උ: ඔව්.

ප්‍ර: ඒගොල්ලන් හිතුවේ මේගොල්ලන් පාතාලයේ කට්ටියක් කියලා. එතකොට ඒ ගොල්ලන් වෙඩි තිබ්බා.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: එතකොට CCD එකේ එක් කෙනෙක් මැරුණා.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ඒ ගොල්ලන් දකින්නේ නැහැ. ඈනලා ගියපු පුද්ගලයෙක්. මහත්මයා පොලිස්පති විධියට, ඔය කියන කණ්ඩායම් දෙකේම නායකයා විධියට මොබයිල් එකේ කණ්ඩායම කියන එක ඒ විධියට වෙන්න පුළුවන් කියලා මහත්මයාට හිතුණේ නැද්ද?

උ: ස්වාමීනි, වැලිගම පොලිසියෙන් ඔය මොබයිල් එක පොලිසියේත් ස්ථානාධිපති තමයි වැලිගම මුලස්ථාන පොලිස් පරීක්ෂක, ඔහු ඒ ගොල්ලන්ගේ මේ සිද්ධියෙන් පස්සේ 31 වැනිදා උදේ 6-7 වෙන කොට ලිඛිතව පණිවුඩයක් ලබා දීලා තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය ඇතුළු තවත් වගකිව යුතු ආයතන ගණනාවකට, එහිදී ඔහු මේ සිද්ධිය සම්බන්ධව කියා තිබෙන්නේ ඒ වෙනකොට වැලිගම පොලීසිය දරපු ස්ථාවරය. ඔබතුමා සඳහන් කළා වාගේම වැලිගම පොලිසියේ මොබයිල් එකෙන් මේ මනුස්සයෙකුට වෙඩි තියලා ඒකෙන් තමයි මේ අය තුවාල වුණේ කියන කාරණාව සඳහන් වෙනවා. CCD එකේ වාහනයේ හිටපු කට්ටිය ඒගොල්ලන්ට හඳුනන්නේ නැති පුද්ගලයෝ කණ්ඩායමක් වෙඩි තිබ්බා කියලා කියනවා; ප්‍රකාශ කරනවා. මේක සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා තිබෙනවා කියලා දැනුම් දීලා තිබෙනවා. ඒක තමයි ඔවුන්ගේ ස්ථාවරය වෙලා තිබෙන්නේ. ඒ නිසා මට මේ CCD එකේ කට්ටිය බොරු කියන්නේ. වැලිගම කට්ටිය තමයි ඇත්ත කියන්නේ කියලා එතැනදී වෙනසක් හඳුනා ගන්න බැහැ. නමුත් වැලිගම කට්ටිය කියන ප්‍රකාශයත් සත්‍යයි. CCD එකේ කට්ටිය කියන කථාවත් සත්‍යයි කියන එක තමයි මගේ ස්ථාවරය වුණේ.

ප්‍ර: වැලිගම මොබයිල් එකේ කට්ටිය කියන එක සත්‍යයක් නම්, CCD එකේ කණ්ඩායම මුලදී කියපු එක අසත්‍යයක් නම්, CCD එකේ කණ්ඩායම අනිවාර්යයෙන්ම නීත්‍යානුකූල නොවන දෙයක් කර තිබෙන්නේ? ඒක හරිද?

උ: ස්වාමීනි, ඒකට මම පිළිතුරක් දෙන්නේ, මම ඒ වනවිට හෝ මගේ වාරණ නියෝගය ලැබෙන තාක්කල් CCD එකේ කට්ටිය අසත්‍යයක් කිව්වේ කියන කාරණාව සම්බන්ධයෙන් මගේ කිසිම දැනුමක් නැහැ. එදාට පසුව තිබුණු තත්ත්වයක් පිළිබඳව තමයි ඔබතුමා මගෙන් විමසීමක් කරන්නේ. ඒ කියන්නේ CCD එකේ කට්ටිය කිව්වේ බොරුවක් කියලා -

ප්‍ර: නැහැ. ඒ දෙකම නොවෙයි. මම කියන්නේ "නම්"; "if" -

උ: බොරුවක් නම් ඉතින් ඒක -

ප්‍ර: එච්චරයි. ඔබතුමා ගත් මතය නොවෙයි.

උ: බොරුවක් නම්, ඒක වැරදියි කියන එක පිළිගන්නවා.

ප්‍ර: ඒක නීත්‍යානුකූල නොවන ක්‍රියාවන්නේ?

උ: බොරුවක් නම් -

ප්‍ර: ඔක ඇත්තක් ද, බොරුවක්ද කියලා හොයා ගන්න නම් විමර්ශනයක් කරන්න වෙනවා.

උ: අනිවාර්යයෙන්ම.

ප්‍ර: ඒ විමර්ශනය වැලිගම - වැලිගම පොලීසිය මාතර පොලීසිය යටතේ තිබෙන්නේ?

උ: ඔව.

ප්‍ර: එතකොට ඒක එක පැත්තක්.

උ: ඔව්.

ප්‍ර: CCD එක තව පැත්තක්.

උ: ඔව්.

ප්‍ර: එතකොට වැඩියෙන්ම හොඳ ක්‍රියාව තමයි ඔය දෙකටම නැති ස්වාධීන unit එකකට ඕක භාර දෙන එක.

උ: මට ඒ වෙලාවේ එහෙම දෙයක් හිතුණේ නැහැ. මොකද, හේතුව ස්වාමීනි, කවුරුවත් කියලා තිබුණේ නැහැ, - මේ කරන විමර්ශනය පිළිබඳ සැක පහළ කරලා තිබුණේ නැහැ. අඩුම ගණනේ මාතර මහෙස්ත්‍රාත්වරයාට ඔය CCTV අරගේ මෙහේ කථාවක් තිබුණා නම්, මේක වෙන බාහිර එකකට දමන්න කියලා මට කිව්වා නම්, අනිවාර්යයෙන්ම මම නොකර ඉන්නේ නැහැ. මොකද, හේතුව මට කිසිම කෙනෙක්ගෙන් - මම කොළඹ ඉන්නේ. මට නිරීක්ෂණය වුණේත් නැහැ. එහේ හිටපු අයට නිරීක්ෂණය වෙලාත් නැහැ, එහෙම අවශ්‍යතාවක් තිබෙනවා කියලා.

ප්‍ර: වැලිගමින් හෝ මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් හෝ ඔය සිද්ධිය සම්බන්ධයෙන් කරපු විමර්ශන කොච්චර කාලයක් විතර නිස්සේ කරගෙන ගියාද, සාමාන්‍ය තත්ත්වයකට එන්න?

උ: සාමාන්‍යයෙන් මාසයක විතර වාගේ කාලයක්.

ප්‍ර: එතකොට ඒක ඉවර වුණාද? එහෙම නැත්නම් ඊට කලින් CID එකෙන් භාර ගත්තාද?

උ: නැහැ. ඒක දිගටම කෙරෙමින් පැවතුණා. මාසයක් විතර වෙනකම් ස්පීඩ් ගිහිල්ලා ඊට පසුව තව තව අලුතින් සිදුවීම් එද්දී ඒක ටිකක් උදාසීන ස්වරූපයෙන් ඇදි ඇදී තිබුණා, ස්වාමීනි.

ප්‍ර: ඔය විමර්ශනයෙන් ප්‍රතිඵල දෙකක් වෙන්න පුළුවන්. එකක් තමයි සීසීඩී එකේ කට්ටිය කරපු දේ නීත්‍යානුකූල නොවෙයි කියන එක.

උ: ඔව්.

ප්‍ර: එහෙම නැත්නම් CCD එකේ කට්ටිය ඇත්තටම නීත්‍යානුකූල වැටලීමකට ඇවිල්ලා, ඔය කියපු විධියට නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි පහරට ලක්වුවා කියන එක. ඔය දෙකෙන් එකක්නේ, වෙන්න පුළුවන්.

උ: ඔව්.

ප්‍ර: ඒ දෙකෙන් එකක්වත් හොයාගෙන නැහැනේ, 31 වෙනකොට?

උ: ඔව්.

ප්‍ර: මොකද, විමර්ශන මාසයක් විතර ගියා නේ?

උ: ඔව්. අපිට අපේක්ෂා කරන්නත් බැහැ ස්වාමීනි, ඒ වාගේ දවස් 2ක් ඇතුළත ඇවිල්ලා ඕකටත් තීරණයක් හොයාගන්න පුළුවන් වෙයි කියලා.

The Respondent IGP has also admitted that Acting Director CCD ASP Neville de Silva did not visit the scene of the crime on 31-12-2023. The reason he attributes to that is the possibility that ASP Neville de Silva would have faced allegations that he influenced the investigations conducted by Weligama police station. However, there are two parties who had claimed to have opened fire in this shooting incident. One party is the Weligama police night mobile patrol. The other party is the CCD team led by CI Anslem de Silva. It is the version of the Weligama police night mobile patrol that they shot at a group of persons opening fire at W15 hotel, thinking that it was an underworld group firing at the hotel for what they suspected at that time was a move to take ransom from the hotel owners.

The Weligama police night mobile patrol team is part of Weligama police station. Even the Respondent IGP has now admitted that it is wrong for the CCD team to have escaped from the scene after Weligama night mobile patrol jeep came there. Despite Police Sergeant Sisira Kumara and Army Sergeant Ruchiranga giving statements to OIC Crimes Weligama, by 6.00 am on 31-12-2023, no further investigation or action has been taken by Weligama police station against the CCD officers. They have just been released on 31-12-2023 itself. The Respondent IGP still states that investigations are proceeding. What that investigation has produced, he does not know. The Respondent IGP has also failed to give a reason as to why he did not direct an investigation to be carried out by an independent unit. The situation

becomes very serious not merely because the Respondent IGP at that time had failed to direct an independent investigation unit to take over the investigation into this shooting incident, but because he still justifies his omission to make such directions.

Regarding **P-45**, **P-46**, **P-47** and **P-48**, the Respondent IGP similarly takes up the position that he conveyed to the National Police Commission what the DIG conveyed to him about the incident. When he was confronted with **P-49** and **P-50** which are the reports submitted to the National Police Commission by the present Acting Inspector General of Police SDIG Priyantha Weerasooriya, he gave the following answer:

ප්‍ර: P49 සහ P50 කියන ලේඛන බලන්න, වර්තමාන වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරියට විමසා තිබෙන ලේඛනය සහ ඔහුගේ ප්‍රතිචාරය. ඔබතුමා ඒ දෙකේ යම්කිසි වෙනසක් දකිනවාද? වර්තමාන වැඩ බලන පොලිස්පතිවරයා දීර්ඝ විමර්ශන ප්‍රගතියක් -

උ: ඔහු ඒ වාර්තාව යවලා තිබෙන්නේ අර සිද්ධියට සම්බන්ධ වුණු නිළධාරීන් විසින් CID විමර්ශනය ආරම්භ කළාට පස්සේ ලැබුණු ප්‍රකාශ වලින් අනාවරණය වුණු කරුණු. එවැනි නිලධාරීන් විසින් කරන ප්‍රකාශයක්, මා රාජකාරි කළ කාල සීමාව තුළ එවැනි ප්‍රකාශයක් ගිහින් තිබුණේ නැහැ. එහෙම එකක් තිබුණා නම් සමහර විට මමක් එවැනි වාර්තාවක් එවන්න තිබුණා.

The position taken up by CI Anslem de Silva (the team leader of the CCD team in the van WP PK-7225) is that they undertook an illegal mission to open fire at W15 hotel at Weligama in the night of 31-12-2023 on the illegal instructions given to them in that regard by the Acting Director CCD ASP Neville de Silva. If so, why is the Respondent IGP so interested in defending either the Acting Director CCD ASP Neville de Silva or CI Anslem de Silva or his team? No explanation for this concern could be found from the evidence adduced before this Committee of Inquiry. Such an interest on the part of an IGP does not stand to reason.

On the other hand, since he is the Inspector General of Police he oversees both Weligama police station, Matara Police Division, CCD and all the other officers in Sri Lanka Police. The question arises as to why he picked on a version which has also now been made invalid by its authors themselves and by the learned Magistrate of Matara by the Order dated 27-02-2025. This situation becomes further serious as the Respondent IGP even at present attempts to justify his action of not taking any interest to direct an independent investigation.

As pointed out by the learned Additional Solicitor General, the Respondent IGP in his second affidavit has rejected the statement of PS 16089 Ajith Sisira Kumara who was in charge of the Weligama police night mobile patrol jeep on 31-12-2023. This is reflected in Clause 90 of his second affidavit dated 09-06-2025. It could therefore be seen that the Respondent IGP in this

regard has taken up different positions at different times. As this is a material fact, the Committee of Inquiry takes the view that it goes to the root of the issue of credibility of the positions taken up by the Respondent IGP. That is not in his favour. The learned Additional Solicitor General confronted the Respondent IGP with Clause 83 of his second affidavit dated 09-06-2025. From the said Clause (Clause 83), it could be seen that the Respondent IGP even in his second affidavit has accepted the fact that it was wrong for the CCD van to speed away when Weligama police night patrol jeep came and stopped at the time the CCD was firing in front of W15 hotel. If this is the view taken up by the Respondent IGP, why does he still attempt to justify the actions of the CCD team members in front of W15 hotel in Weligama? Why did he state in his report sent to NPC that there was no lapse on the part of CCD officers? Moreover, the Respondent IGP even at present, attempts his best to convince this Committee of Inquiry that the incident of shooting in front of W15 hotel at Weligama which occurred around 2.20 am on 31-12-2023 has happened in the way the CCD team members had first told the Weligama police station. This assumes a greater importance and concern because by this time CI Anslem de Silva and his other team members have abandoned their original position. Then what is the necessity for the Respondent IGP to still attempt to establish that version? That is a version which its authors themselves have now jettisoned, a version they admit having fabricated. Should this Committee accept such a version as the correct version? Answer is clearly no.

(25) Evidence of DIG Kapugamaralalage Jagath Chandra Kumara.

This witness was the Deputy Inspector General of Police in charge of Colombo District and therefore the CCD came under his direct supervision at the relevant time. Police Divisions namely: Colombo Central; Colombo South; Colombo North; Colombo Fraud Bureau; and Colombo Crimes Division; were all supervised by this witness in his capacity as the DIG Colombo. It is this witness who was in office as DIG Colombo during the relevant time of the shooting incident at Weligama on 31-12-2023. Although this witness first attempted to state in his evidence that the CCD was assigned the responsibility of conducting investigations into *Harak Kata's* heroin distribution network, later on he had stated that the assignment given to the CCD by the Respondent IGP was restricted to persons who maintained links with *Harak Kata*. Upon further questioning, he admitted that he had not seen any document in that regard. Thus, admittedly although he claims to have supervised investigations pertaining to *Harak Kata's* dealings, he remains a person who has not even seen **R-2** up until now. However,

he has told this Committee from his memory that the list contained the names of 149 persons. Then the question arises as to how he could remember this figure and told it to the Committee of Inquiry from his memory. The only explanation he has offered is that the Director CCD had told him at that time. When confronted, this witness has later on admitted that he could not have effectively supervised any investigation without even seeing the initial document relevant to the assignment. This is reflected from the following questions and answers:

ප්‍ර: එතකොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා ඒ ලේඛනය කාට දුන්නා කියලා ඔබතුමා දන්නවද?

උ: ඒක කොළඹ අපරාධ කොට්ඨාශයට විමර්ශන සඳහා භාර දුන්නා කියලා මම දැන ගත්තා.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඒ ලේඛනය දැකලා තිබෙනවාද?

උ: නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒක මොන වගේ ලේඛනයක්ද කියලා මහත්මයා දන්නේ නැහැ?

උ: මම දන්නේ නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒක කවද භාර දීපු ලේඛනයක්ද කියලාත් දන්නේ නැහැ?

උ: නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒකෙන් බලාපොරොත්තු වෙච්ච විමර්ශනය මොකක්ද කියලාවත් මහත්මයාට අවබෝධයක් නැතුව ඇති?

උ: ස්වාමීනී, මගේ මතකයේ හැටියට ඒකේ නම් 149 ක් වගේ ප්‍රමාණයක් තිබුණා. ඔවුන් සම්බන්ධව,-

ප්‍ර: දැක්කෙ නැහැ කිව්ව නේ?

උ: මට අධ්‍යක්ෂවරයා කියා තිබුණා. ලේඛනය දැක්කේ නැහැ. නමුත්, අධ්‍යක්ෂවරයා මට කියා තිබුණා මෙන්න මෙහෙම විමර්ශනයක් භාර දුන්නා කියලා.

ප්‍ර: සාමාන්‍යයෙන් අධ්‍යක්ෂවරයාත් එක්ක විමර්ශන ගැන කථා කරනවාද?

උ: එහෙමයි ස්වාමීනී.

ප්‍ර: හැමදාම වගේ?

උ: අපි රූස්වෙනවා දින දෙක තුනකට සැරයක්. එතකොට අපි සමාලෝචනය කරනවා විමර්ශන සම්බන්ධයෙන්.

ප්‍ර: ඔය වගේ සාකච්ඡා කරපු අනෙක් විමර්ශන මොනවද?

උ: ස්වාමීනී, ඒ කාල වකවානුවේම තමයි. තවත් අපරාධකරුවන් තවත් සිටිනවා, හරක් කටාට අමතරව්. කොළඹ අපි හඳුනාගත්ත කිඹුලා ඇළේ ගුණා, වැල්ලේ සාරංග, පුකුඩි කන්නා.

ප්‍ර: කිඹුලා ඇළේ ගුණා ගැන මොන වගේ විමර්ශනයක් ද කළේ?

උ: ස්වාමීනී, මම කොළඹ හිටපු කාලය තුළ සිදු වූ යම් යම් අපරාධවලදී මේ නම් කියැවුණා. මොවුන්ගේ සම්බන්ධතා කියැවුණා.

ප්‍ර: ඒකේ විමර්ශනය මොකක්ද කියලා හරියටම මතක නැහැ?

උ: මත්ද්‍රව්‍ය ජාලය සම්බන්ධයෙන් තමයි ප්‍රධානම විමර්ශනය සිදුවුණේ.

ප්‍ර: මහත්මයාට මතකද නැද්ද කියන්න?

උ: ස්වාමීනී, මට මතක තිබෙන්නේ, ඔවුන්ගේ අනුගාමිකයන්, ලංකාවේ ක්‍රියාකාරීන් සම්බන්ධ විමර්ශන තමයි භාර දුන්නේ.

ප්‍ර: කී දෙනෙක්ද?

උ: ප්‍රමාණයක් දන්නේ නැහැ.

ප්‍ර: මේකේ 149 මතක හිටියේ කොහොමද?

උ: අධ්‍යක්ෂවරයා කියා තිබුණා.

ප්‍ර: ඒක මහත්මයාට මතක හිටියේ කොහොමද කියන එක මට ප්‍රශ්නයක්. මහත්මයා ඔය ලේඛනය දැක්කේ නැහැ?

උ: ලේඛනය දැක්කේ නැහැ ස්වාමීනි.

ප්‍ර: අද වෙනකල් දැකලා තිබුණේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: 149 මතකයි?

උ: ඔව්.

ප්‍ර: ඒකයි මම ඇහුවේ තිඹුලා ඇළේ ගුණා ගැන. මෙසේ චිතරක් 149 ප්‍රමාණය මතක හිටියේ කොහොමද?

උ: ඒක මාධ්‍ය වලත් ගියා ස්වාමීනි.

ප්‍ර: මාධ්‍ය වල ගිය නිසා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ කියන්නේ වැලිගම සිද්ධිය මාධ්‍ය වල ගිය නිසාද?

උ: එහෙමයි ස්වාමීනී.

ප්‍ර: දැන් මේ විමර්ශනය මහත්මයා අධීක්ෂණය කළාද නැද්ද?

උ: සෘජුව අධීක්ෂණයක් නොවෙයි ස්වාමීනී.

ප්‍ර: මහත්මයාට තේරෙනවද මම අහන කාරණය?

උ: එහෙමයි.

ප්‍ර: මහත්මයා, අපරාධ අංශයේ නියෝජ්‍ය පොලිස්පති. විමර්ශනය අධීක්ෂණය කරන්න බැහැ නේ ඔය මොකක්වත් දකින්නේ නැතුව? එහෙම පුළුවන්ද අධීක්ෂණ කරන්න?

උ: බැහැ ස්වාමීනී.

DIG Jagath Chandra Kumara has admitted signing Police Form 439 to recommend the CCD team, led by CI Anslem de Silva, to travel to Weligama on 30-12-2023. Although at initial stages he had stated that he received approximately 100 such Police Form 439 documents, in face of further questioning, he has admitted that he only received 02 or 03 of such Police Form 439 documents in his office per day.

DIG Jagath Chandra Kumara has identified the documents marked **P-13** to **P-16**. It is his position that he signed **P -13** to **P-16** to recommend payment of reward, as he was satisfied that the team of CCD officers led by CI Anslem de Silva had gone to Weligama to engage in an official duty. According to him, he has verified this from the Acting Director CCD ASP Neville de Silva, SSP Matara Pandula Weerasinghe and ASP Matara Arunalal. It is the position of DIG Jagath Chandra Kumara that he still takes the view that SI Maduranga and PS Upul of the CCD team received injuries from gunfire which came from an unknown gunman. This is despite the fact that he continued to be in charge and supervised the CCD as DIG Colombo up until 05-

12-2024. His position in this regard would be gathered from the following questions and answers:

ප්‍ර: ඔය සිද්ධියට පසුව කවදා වෙන කල් CCD එකේ සිටියාද?

උ: 2024.12.05 වැනිදා වෙනකල් කොළඹ දිශාව භාරව සිටියා ස්වාමීනි. 2024.12.05 වැනිදා තමයි මම ස්ථාන මාරුවීම් ලැබුවේ.

ප්‍ර: දැන් මහත්මයාගේ ස්ථාවරය CCD එකේ පොලිස් සැරයන් උපුල්ට වෙඩි වැදුණේ නාඳුනන තුවක්කුකරුවෙක් තියපු වෙඩි පහරකින් කියා එක?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඒක කියන්නෙත් එවකට CCD එක භාරව හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: CCD එකේ මහත්මයා නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට සිටියා 2024.12.05 වැනිදා වෙනකල්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ සිද්ධියට පස්සේ අවුරුද්දකට ආසන්න කාලයක් සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා එවකට CCD එක භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට මහත්මයාගේ ස්ථාවරය සහ මහත්මයාගේ අවබෝධය CCD එකේ 2023.12.31 වැනිදා වෙඩි වැදිලා තුවාල වෙච්ච SI මධුරංගට තුවාල වුණේ නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි පහරකින් කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක ස්ථිරයි?

උ: මා දැනට දන්නේ එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක තමයි මහත්මයා සොයා ගත්තේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගේ අවබෝධය අනුව වෙන කවුරුවත් වෙන විධියකට සොයා ගෙන

උ: මා දන්නා තරමින් නැහැ ස්වාමිනි.

ප්‍ර: මහත්මයාගේ සාක්ෂිය අනුව, මහත්මයා ඔය මතයට ආවේ මාතර ඔය විමර්ශනය භාරව ඉන්න නිලධාරීන්ගෙන් කරුණු විමසලා?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, මාතරින් ස්වාමීනි.

ප්‍ර: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කවුද?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පණ්ඩුල වීරසිංහ.

ප්‍ර: මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා මහත්මයාට කිව්වේ ඔය විධියට ඔක වුණා කියලාද?

උ: එහෙමියි ස්වාමීනි.

ප්‍ර: මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයා කමන්ට කිව්වේ. ඔය CCD එකේ තුවාල වෙච්ච දෙදෙනාට තුවාල වුණේ නාඳුනන තුවක්කුකරුවකුගේ වෙඩි ප්‍රහාරයකින් කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: වැලිගම මු.පො.ප. ටත් කථා කළාද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: වැලිගම පොලිස් නිලධාරීන් ඉහළ සිට පහළ සියලු තනතුරු, OIC (Crimes). නියෝජ්‍ය පොලිස්පතිවරයා, මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරය, වැලිගම ඒඑස්පී. වැලිගම එච්කිව්අයි. වැලිගම OIC (Crimes), ඒගොල්ලෝ සේරම ඔය ස්ථාවරය තමයි අරගෙන තිබෙන්නේ?

උ: ස්වාමීනි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කියපු දේ පමණයි මම දන්නේ. අනෙක් අය සමඟ මම සම්බන්ධ වුණේ නැහැ.

ප්‍ර: මහත්තයා ඔය ටික වාර්තාවකින් ද ගෙන්වා ගත්තේ නැත්නම් වාචිකවද? ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් වාර්තාවක්ද ගෙන්වා ගත්තේ, නැත්නම් වාචිකවද?

උ: වාචිකව, දුරකථනයෙන් සම්බන්ධ වුණේ.

ප්‍ර: පණ්ඩුල වීරසිංහ මහත්මයා ඕක තමයි සොයාගෙන තිබෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: මහත්තයා කටයුතු කළේ ඒ අනුව?

උ: මම විශ්වාස කළා ස්වාමීනි.

ප්‍ර: තාමත් විශ්වාස කරන්නේ එහෙම?

උ: වෙනත් දෙයක් දැනගන්න ලැබුණේ නැහැ ස්වාමිනි, ඒ නිසා.

The Committee of Inquiry is compelled to observe here that unlike this witness, the Respondent IGP at least in the face of questioning did not take up the position that he up until now did not know that it was Army Sergeant Ruchiranga who was a member of Weligama night mobile patrol who shot at the van carrying CCD team. Thus, the question before the Committee is as to whose version of events this witness has sought to support before this Committee of Inquiry? It is one of his own but is a non-existent position.

Answering further questions, it was revealed that this witness remembered details of an incident in which a police officer was killed in the year 2003 when he functioned as ASP Avissawella. However, with regard to the incident of shooting which occurred in December 2023, this witness could not remember any material fact. This is despite the fact that CCD was directly under his purview at the relevant time. There is no acceptable explanation before the Committee of Inquiry as to why this witness did not remember the facts pertaining to the shooting incident at Weligama on 31-12-2023 which became widely publicized in the country and raised the concerns of the people in this country. The situation is further exacerbated as the facts pertaining to the 2003 incident which is more than 20 years ago are still fresh in his mind. This position DIG Jagath Chandra Kumara takes up in the minds of the Committee, would seriously affect his credibility particularly because he was the DIG who directly supervised the CCD at the relevant time.

This witness was the chairman of the committee appointed by the Respondent IGP which recommended a promotion to PS Upul of the CCD who was killed in the shooting incident at Weligama. The said committee under the chairmanship of this witness had comprised of SSP Colombo Central Lalith Leelaratne and CI Balasuriya who at that time functioned as the OIC of the Colombo Fraud Bureau. It is this witness's evidence that this committee unanimously recommended a granting of a promotion to PS Upul. He also admits recommending and signing the reward application and forwarding the same to the Respondent IGP. It is his position that he was satisfied after verification from the relevant local police authorities in Matara that PS Upul was killed by the gunfire from an unknown gunman. When asked whether he knew about the arrival of any mobile patrol from Weligama police station, he has provided the following answers before this Committee:

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: සාක්ෂිකරුට මොකක්ද මතක?

උ: ජංගම මුර සංචාරයක් සම්බන්ධව.

ප්‍ර: එතැනදී මොකාක්ද වෙලා තිබෙන්නේ?

උ: වැලිගම පොලීසියේ ජංගම මුර සංචාරක රථයක් මෙම ස්ථානයට ඇවිල්ලා කියලා එම වාර්තාවේ තිබුණා.

ප්‍ර: සාක්ෂිකරුට මතක එච්චරයි ද?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: එච්චරයි මතක?

උ: එහෙමයි.

ප්‍ර: වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරයේ,-

උ: ඒ නිලධාරින් එම ස්ථානයට පැමිණියා කියලා ඒ වාර්තාවේ සඳහන් වුණා මතකයි.

ප්‍ර: මොකකින්ද ඇවිල්ලා තිබෙන්නේ?

උ: "ජංගම සංචාරය" කියලා තමයි සඳහන් වුණේ, ස්වාමීනි.

ප්‍ර: පයින් ද, වාහනයකින්ද?

උ: වාහනයකින්, ස්වාමීනි.

ප්‍ර: මොන වගේ වාහනයකින්ද?

උ: ජංගම සංචාරයක් කියලා තමයි සඳහන් වුණේ. වාහනයේ වර්ගය සඳහන් වුණාද කියලා මට මතක නැහැ, ස්වාමීනි.

ප්‍ර: වාහනයේ වර්ගය ඕනෑ නැහැ මහත්මයා. බස් එකක්ද, මොකක්ද?

උ: ජංගම රථය කියලා තමයි සඳහන් වෙලා තිබුණේ, ස්වාමීනි. මොකක්ද කියලා සඳහන් වෙලා තිබුණේ නැහැ.

ප්‍ර: සාමාන්‍යයෙන් පොලිස් ජංගම මුර සංචාර විවිධ වාහන වලින් යනවාද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: එදා ගිය වාහනය මොකක්ද කියලා මහත්මයා දන්නේ නැද්ද? මේ වෙන කොටත් දන්නේ නැද්ද?

උ: නැහැ, ස්වාමීනි.

ප්‍ර: බස් එකක්ද, මෝටර් සයිකල් එකක් ද කියලා දන්නෙ නැද්ද?

උ: ජංගම රථයක් කියලා කමයි මම දන්නේ, ස්වාමීනි.

ප්‍ර: ජංගම සංචාරවල මෝටර් සයිකලුත් යනවා නේද?

උ: ඔව්, මෝටර් සයිකලුත් යනවා, ස්වාමීනි.

ප්‍ර: මෝටර් සයිකල් එකක්ද ගියේ කියලාත් මහත්මයා දන්නේ නැද්ද?

උ: නැහැ, ස්වාමීනි.

ප්‍ර: මේ වෙනකල් දන්නේ නැද්ද?

උ: නැහැ, ස්වාමීනි.

ප්‍ර: දන්නවා නම්, මේ අහන ප්‍රශ්නවලට උත්තර දෙනවානේ. නේද?

උ: එහෙමයි, ස්වාමීනි.

The afore-mentioned evidence given by this witness is self-explanatory. It is therefore the view of the Committee that one does not need any more reasons to understand the quality of the evidence of this witness who claimed to have supervised the investigations carried out by the CCD at the relevant time when the CCD team went to Weligama on 30-12-2023. Suffice it to say that DIG Colombo who was supposed to have supervised CCD as at the date relevant to this incident does not exclude the possibility that it could be even a motor bicycle which came as the mobile patrol from Weligama Police to the place where the shooting took place. It is with this knowledge that he has recommended a payment of reward and chaired the Committee which had recommended a promotion to PS Upul who was killed in the relevant incident of shooting. This Committee regrets its inability to accept and act upon the evidence of this quality.

(26) Cross-examination of DIG Jagath Chandra Kumara by the Additional Solicitor General.

Answering the questions asked from him by the learned Additional Solicitor General, DIG Jagath Chandra Kumara has stated before this Committee that he permitted the CCD team led by Anslem de Silva to travel to Weligama in uniform. It was his position that if he knew that the said team was attempting to go to Weligama in civil clothes on 30-12-2023, he would not have allowed them to proceed to Weligama in that way. However, when the learned Additional Solicitor General confronted him with the document **P-15**, he had to admit that even at the time of granting his recommendation, the document **P-15** had already indicated that this team had requested permission to go to Weligama in civil clothes. It is that request which this witness had recommended to the Respondent IGP. Thus, this witness has taken up two completely contradictory positions in this regard.

It is the consistent position take up by this witness that Acting Director CCD ASP Neville de Silva informed him about the incident of shooting in which PS Upul of the CCD was killed, at about 9.00 am - 10.00 am on 31-12-2023 after he went to his office.

According to him, what ASP Neville de Silva had told him at that time was that PS Upul was killed and SI Maduranga was injured by gunfire by an unknown gunman. Despite the fact that he was informed by ASP Neville de Silva about this incident after he came to office between 9.30 am and 10.00 am, even to date he does not know as to what time ASP Neville de Silva had got to know about this incident. The answers provided by this witness to the questions posed to him in this regard shows that this witness does not understand or does not appreciate or does not care about the seriousness of this issue. It is the position of this witness that despite the fact that he continued to be the DIG Colombo overseeing affairs of the CCD up until 05-12-2024, he was not interested in probing further into this incident. The excuses he has given when repeatedly questioned in this regard are not acceptable to this Committee. Indeed, they are not excuses. This witness became uneasy when he was confronted with these questions. It is relevant to reproduce rather than paraphrasing the relevant parts of this evidence which is as follows:

ප්‍ර: එදා W15 හෝටලය ආසන්නයේ වෙච්ච සිද්ධිය තමුන් දැන ගත්තේ කීයටද?

උ: ස්වාමීනි. මගේ මතකයේ හැටියට නවයාහමාර, දහය වාගේ වෙලාවක තමයි දැන ගත්තේ.

ප්‍ර: උදේ?

උ: උදේ. ස්වාමීනි.

ප්‍ර: කවුද තමුන්ට නවයාහමාර, දහයට විතර ඒ සිද්ධිය දැනුම් දුන්නේ?

උ: මගේ මතකයේ හැටියට වැඩබලන අධ්‍යක්ෂවරයා විසින් තමයි මට සිද්ධිය දැනුම් දුන්නේ.

ප්‍ර: නම වශයෙන් සඳහන් කළොත් කවුද?

උ: සහකාර පොලිස් අධිකාරි නෙවිල් ද සිල්වා.

ප්‍ර: තමුන්ට දැනුම් දුන්න විධියට සිද්ධිය කීයට විතරද වෙලා තිබෙන්නේ?

උ: අලුයම කියලා කිව්වේ, ස්වාමීනි.

ප්‍ර: කියට විතරද?

උ: පාන්දර 4 වාගේ වෙලාවක.

ප්‍ර: තමුන් තමයි අධීක්ෂණ නිලධාරියා හැටියට කටයුතු කරන්නේ කොළඹ අපරාධ කොට්ඨාශයේ?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: තමා ඒ සිද්ධිය ගැන දැනුවත් වුණා කිව්වේ කීයටද?

උ: නවයහමාර, දහය වාගේ වෙලාවට, ස්වාමීනි.

ප්‍ර: දැන් අධීක්ෂණ නිලධාරියා හැටියට තමන් යටතේ තිබෙන ක්‍රණ්ඩායමක් යම්කිසි සිද්ධියකට මුහුණ පෑවාම ඒක තමුන්ට දැනුම් දෙන්න වග කීමක් තිබෙනවා නේද ඉතාම කඩිනමින්.

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේදී එහෙම දෙයක් වෙලා තිබෙනවාද?

උ: නැහැ, ස්වාමීනි. මට ඒක පසුව තමයි දැනුම් දීලා තිබෙන්නේ.

ප්‍ර: දැන් තමුන් කියන විධියටම තුනයි ගණනට වෙච්ච සිද්ධියක් තමුන්ට දැනුම් දෙනකොට වෙලාව කීයද කිව්වේ?

උ: නවයාහමාර, දහය වාගේ වෙලාවට තමයි.

ප්‍ර: අධීක්ෂණ නිලධාරියා හැටියට එහෙම සිද්ධියක් වුණාම ඉතා කඩිනමින් ඒක තමුන්ට කවුද දැනුම් දෙන්න ඕනෑ?

උ: අධ්‍යක්ෂවරයා දැනුම් දිය යුතුයි, ස්වාමීනි.

ප්‍ර: අධ්‍යක්ෂවරයා තමුන්ට දැනුම් දුන්නේ මොකක්ද ඒ අවස්ථාවේ?

උ: මේ සිද්ධිය සම්බන්ධයෙන් ස්වාමීනි, දැනුම් දුන්නා. නාදුනන වෙඩික්කරුවකුගේ වෙඩි පහරකට ලක් වෙලා දෙදෙනෙක් තුවාල ලැබුවා; පොලිස් සැරයන්වරයා මිය ගියා; කරාපිටිය රෝහලට ඇතුළු කළා කියන විස්තරය මූලික වශයෙන් ලබා දුන්නා, ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ. සිද්ධිය සිදු වෙලා පැය කීයකට විතර පස්සේද අධීක්ෂණ නිලධාරියා හැටියට තමුන්ට ඒ දැනුම් දීම කරලා තිබෙන්නේ?

උ: පැය දෙක, තුනකට පස්සේ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: අධ්‍යක්ෂවරයා දැනගෙන තිබෙන්නේ කීයටද?

උ: ඒක දන්නෙ නැහැ. ස්වාමීනි.

ප්‍ර: දන්නේ නැහැ?

උ: අධ්‍යක්ෂවරයා දැනගත් වෙලාවක් සම්බන්ධව මම දැනුවත් නැහැ, ස්වාමීනි.

ප්‍ර: තවම දන්නේ නැද්ද?

උ: උදෑසන සිද්ධිය වුණ ගමන් උදෑසන කිව්වා කියලා ආරංචිය තිබුණේ. අධ්‍යක්ෂවරයා කිව්වේ පාන්දර කිව්වා කියන එක. වෙලාවක් සඳහන් කළේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: හරියටම වෙලාව නොවෙයි. සිද්ධිය සිදු වූ වහාම වාගේ අධ්‍යක්ෂවරයා දැන ගෙනද?

උ: ඒ සම්බන්ධව දන්නේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: මේ වන කල් දන්නේ නැද්ද?

උ: දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට ප්‍රශ්නයක් වුණේ නැද්ද, මහත්මයාට සෘජු අධීක්ෂණ නිලධාරියා විධියට නවයාහමාර වන කල් ඒ සිද්ධිය ගැන මහත්මයාට කිව්වේ නැහැ කියන එක කවුරුවත්?

උ: ප්‍රශ්නයක් වුණා, ස්වාමීනි. මම ඒ සම්බන්ධව විමර්ශනය කළා. අධ්‍යක්ෂවරයාගෙන් විමසා සිටියා ප්‍රමාදයට හේතුව සම්බන්ධව.

ප්‍ර: එකකොට?

උ: එතකොට මොකුත් කිව්වේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: මුකුත් කිව්වේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: මහත්මයාටත් ප්‍රශ්නයක් නැහැ?

උ: සිදුවීම සිදු වුණාට පස්සේ උසාවියේ නේ. වැඩිදුර සොයා බැලුවේ නැහැ.

ප්‍ර: සොයා බලන්න අවශ්‍යතාවකුත් වුණේ නැහැ.

උ: තිබුණා, ස්වාමීනි.

ප්‍ර: හොයලා බැලුවාද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මොකක්ද සොයා ගත්තේ?

උ: ඒ සිදුවීම ගැන අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දුන්න දේ නිවැරදියි කියලා පරීක්ෂා කළා, ස්වාමීනි.

ප්‍ර: සිද්ධිය ගැන නොවෙයි, මම අහන්නේ. මහත්මයාට දැනුම් දුන්නේ නැති එක ගැන?

උ: වෙනම විමර්ශනයක් කළේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට උනන්දුවක් තිබුණා ද ඒක හොයා ගන්න? විමර්ශන ගැන නේ හැම තිස්සේම කියනවා නේ.

උ: මට ඒ ගැන උනන්දුවක් තිබුණේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගෙන් දැන් අපි ප්‍රශ්න අහන්නේ මහත්මයා කියන දේ ගැන උනන්දුවක් තිබෙන නිසා.

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: නීතිඥ මහත්වරු දෙපැත්තෙන්ම ප්‍රශ්න අහන්නේ ඒ කියන දේ සම්බන්ධව උනන්දුවක් තිබෙන නිසා.

උ: එහෙමියි, ස්වාමීනි.

ප්‍ර: වෙන වචන වලින් කියනවා, සාක්ෂිකාරයෙක් හෝ කවුරු හරි කියන දෙයක් එලෙසම පිළිගන්න පුළුවන්ද, බැරිද කියන එක. එහෙම නේද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මහත්මයා සැකකාරයන්ගෙන් ප්‍රශ්න අහලා ඇති නේද?

උ: එහෙමයි, ස්වාමීනි,

ප්‍ර: උනන්දුවක් නැත්නම් දෙයක් හොයා ගන්න පුළුවන්ද කාගෙන් හරි?

උ: බැහැ, ස්වාමීනි.

ප්‍ර: බැහැ නේ?

උ: බැහැ, ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට අධීක්ෂණ නිලධාරියෙක් විධියට වගකීමක් නැද්ද, මෙච්චර වෙලා මහත්මයා කිව්වා නේ, වගකීමක් තිබෙනවාය කියලා මහත්මයාට වහාම දැනුම දෙන්න.

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මහත්මයා නිදාගෙන හිටියත් මහත්මයාට දැනුම් දෙන්න ඕනෑ.

උ: එහෙමයි.

ප්‍ර: මහත්මයා ඇහැරෙන කල් ඉන්න ඕනෑ නැහැ නේ?

